# දෙවන බස

# සිංහල

## 09 ශ්‍රේණිය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

ප්‍රථම මුද්‍රණය 2017
දෙවන මුද්‍රණය 2018
තෙවන මුද්‍රණය 2019
සිව්වන මුද්‍රණය 2020

සියලු හිමිකම් ඇවිරිණි.

**ISBN 978-955-25-0375-7**

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
මත්තේගොඩ, වාසනාවත්ත පාර, අංක 90 දරන ස්ථානයෙහි පිහිටි
විශ්ව ග්‍රැෆික්ස් (පුද්ගලික) ආයතනයේ
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.

Published by : Educational Publications Department
Printed by : Vishwa Graphics (Pvt) Ltd.

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා - ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති - අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ - අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ - අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නො ව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

ආනන්ද සමරකෝන්

# පෙරවදන

දියුණුවේ හිණිපෙත කරා ගමන් කරනා වත්මන් ලොවට, නිතැතින්ම අවැසි වනුයේ වඩාත් නව්‍ය වූ අධ්‍යාපන ක්‍රමයකි. එමගින් නිර්මාණය කළ යුත්තේ මනුගුණදම් සපිරුණු හා කුසලතාවලින් යුක්ත දරුපරපුරකි. එකී උත්තුංග මෙහෙවරට ජව බලය සපයමින්, විශ්වීය අභියෝග සඳහා දිරියෙන් මුහුණ දිය හැකි සිසු පරපුරක් නිර්මාණය කිරීම සඳහා සහාය වීම අපගේ පරම වගකීම වන්නේ ය. ඉගෙනුම් ආධාරක සම්පාදන කාර්යය වෙනුවෙන් සක්‍රීය ලෙස මැදිහත් වෙමින් අප දෙපාර්තමේන්තුව ඒ වෙනුවෙන් දායකත්වය ලබා දෙන්නේ ජාතියේ දරුදැරියන්ගේ නැණ පහන් දල්වාලීමේ උතුම් අදිටනෙනි.

පෙළපොත විටෙක දැනුම් කෝෂ්ඨාගාරයකි. එය තවත් විටෙක අප වින්දනාත්මක ලොවකට ද කැඳවාගෙන යයි. එසේම මේ පෙළපොත් අපගේ තර්ක බුද්ධිය වඩවාලන්නේ අනේකවිධ කුසලතා පුබුදු කරවාගන්නට ද සුවිසල් එළි දහරක් වෙමිනි. විදුබිමෙන් සමුගත් දිනක වුව අපරිමිත ආදරයෙන් ස්මරණය කළ හැකි මතක, පෙළපොත් පිටු අතර දැවටී ඔබ සමඟින් අත්වැල් බැඳ එනු නොඅනුමාන ය. මේ පෙළපොත සමඟම තව තවත් දැනුම් අවකාශ පිරි ඉසව් වෙත නිති පියමනිමින් පරිපූර්ණත්වය අත් කරගැනුමට ඔබ සැම නිරතුරුව ඇප කැප විය යුතු ය.

නිදහස් අධ්‍යාපනයේ මහානර්ඝ ත්‍යාගයක් සේ මේ පුස්තකය ඔබ දෝතට පිරිනැමේ. පෙළපොත් වෙනුවෙන් රජය වැය කර ඇති සුවිසල් ධනස්කන්ධයට අර්ථසම්පන්න අගයක් ලබා දිය හැක්කේ ඔබට පමණි. මෙම පාඨ්‍ය ග්‍රන්ථය මනාව පරිශීලනය කරමින් නැණ ගුණ පිරි පුරවැසියන් වී අනාගත ලොව ඒකාලෝක කරන්නට දැයේ සියලු දූ දරුවන් වෙත දිරිය සවිය ලැබේවායි හදවතින් සුබ පතමි.

පෙළපොත් සම්පාදන කාර්යය වෙනුවෙන් අප්‍රමාණ වූ සම්පත්දායකත්වයක් සැපයූ ලේඛක, සංස්කාරක හා ඇගයුම් මණ්ඩල සාමාජික පිරිවරටත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සැමටත් මාගේ හදපිරි ප්‍රණාමය පුදකරමි.

**පී. එන්. අයිලප්පෙරුම**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2020.06.26

**නියාමනය හා අධීක්ෂණය**

පී.එන්. අයිලප්පෙරුම — අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

**මෙහෙයවීම**

ඩබ්ලිව්. ඒ. නිර්මලා පියසීලි — අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

**සම්බන්ධීකරණය**

ප්‍රගීතිකා ජයසේකර — සහකාර කොමසාරිස්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

එම්. ඩී. කේ. මාවලගේ — සහකාර කොමසාරිස්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ඩී. එම්. මල්කා මිලානි — සහකාර කොමසාරිස් (2020 නැවත මුද්‍රණය)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

**සංස්කරණය**

මහාචාර්ය රත්න විජේතුංග — ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

ඩබ්ලිව්.පී. මංගල ගුණරත්න — ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
ජාතික අධ්‍යාපන ආයතනය.

එම්. ජී. මුණසිංහ — ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ජාතික අධ්‍යාපන ආයතනය.

**ලේඛක මණ්ඩලය**

එම්. එච්. අනුෂා සජීවනි — කථිකාචාර්ය, ගුරු විද්‍යාල, කෝප්පායි,
යාපනය.

ධම්මිකා කරල්ලියද්ද — නියෝජ්‍ය විදුහල්පති,
කුලි/කිතලව පූගල්ල ම.වි., කුලියාපිටිය.

ටී. පී. ඇරැව්ගොඩ — ගුරුසේවය,
කලෙයිමගල් දෙමළ විද්‍යාලය, මහනුවර.

එස්. එන්. සෝමසිරි — ගුරුසේවය,
ව/ රම්බායිකුලම් කාන්තා ම.වි.,
වව්නියාව.

එන්. එච්. එම්. ෆාරුක් — ගුරුසේවය (විශ්‍රාමික), තකියා පාර, මහවත්ත, මාවනැල්ල.

## සෝදුපත් කියවීම

ජයත් පියදසුන් — නියෝජ්‍ය ප්‍රධාන උපකර්තෘ, සිළුමිණ ලේක්හවුස්, කොළඹ 10

## භාෂා සංස්කරණය

එස්. වඩිවේල් — ගුරුසේවය, රත්නපුර දෙමළ ම.වි., රත්නපුර.

## චිත්‍ර හා පිටකවර නිර්මාණය

ටී. ඒ. ආර්. ජයසේන — කථිකාචාර්ය, සෞන්දර්ය දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම

## පරිගණක සහාය, පිටු සැකසුම

අමාලි සෙව්වන්දි ගුණසේකර — පරිගණක තාක්ෂණික සහායක, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

පිවිසෙන්න නිදහසේ සතුටින් දැනුම සොයා.. ට... www.e-thaksalawa.moe.gov.lk
The National e-learning Portal for the General Education

# පටුන


| | | |
|---|---|---|
| 01 | යුතුකම (3.4) | 01 |
| 02 | ඔසු උයන (2.4) | 08 |
| 03 | අධ්‍යාපන චාරිකාව (1.2, 2.7) | 15 |
| 04 | බස් එක එනතුරු (1.4, 1.1) | 24 |
| 05 | වැඩිහිටියන්ට සලකමු (2.3) | 31 |
| 06 | නරිබෑනා (1.5, 3.2, 4.4) | 38 |
| 07 | ලෑලි පාලම (2.6) | 47 |
| 08 | අම්බුළුවාවේ සිරිය පෙනෙයි (3.3, 2.5) | 55 |
| 09 | අපි කොළඹ යමු (2.1, 3.1) | 64 |
| 10 | තල් ගම්මානය (2.2) | 72 |
| 11 | කෑම කමු (1.3) | 79 |
| 12 | යාළුවාගේ ගෙදර යන දවස (4.2) | 86 |
| 13 | ආරාධනා පත්‍රයක් හදමු (4.1, 4.3, 4.5) | 93 |

1

# යුතුකම

**සීයේ! සීයේ!**

අම්මේ, කෝ සීයා...?

සීයා වත්ත පහළ ...

ආ ... සීයා වැඩ.

**සීයේ සීයේ, මොකද කරන්නේ?**

**මොකට ද ඔය බිම හාරන්නේ?**



මම මේ අඹ ඇටයක් හිටවනවා, පුතේ.

අඹ ඇටයක් හිටවනවා!

ඔව් පුතේ ......

ඉතිං සීයේ ඔය අඹ ඇටේ හිටෙව්වාට

සීයාට එක අඹයක්වත් කන්න ලැබෙයි ද?

මට කන්න නොවෙයි මගේ පුතේ,

මම මගේ යුතුකමයි මේ ඉටු කරන්නේ.

යුතුකම ?

ඔව් මගේ පුතේ.

ඉතිං සීයේ තමන්ට ප්‍රයෝජනයක් නැති දේකට

ඔය හැටි වෙහෙසෙන්නේ ඇයි කියලා මට තේරෙන්නේ නෑ.

එහෙම හිතන්න හොඳ නෑ පුතේ.

ඒ කිව්වේ සීයේ?

පුතේ, අතීතයේ ජීවත් වූ අය හිටවපු ගස්වල ගෙඩි අද අපි කනවා. අපෙන් පසුව ඉන්න අයට ප්‍රයෝජනයට ගන්න අපි ගස් හිටවන්න ඕනෑ.

හරි හරි සීයේ, මට දැන් තේරුණා.

හෙට ගැන හිතා අද අපේ යුතුකම් ඉටු කරන්න ඕනෑ.

අන්න හරි පුතේ,

මගේ රත්තරං පුතාට හොඳට තේරුණා.

බොහෝම ස්තුතියි සීයේ.

# වචන මාලාව

| | | |
|---|---|---|
| සීයේ | - | தாத்தா |
| පුතේ | - | மகனே |
| අඹ ඇටයක් | - | மாம்பழ வித்து |
| අපි | - | நாம் |
| අපේ | - | எமது |
| මොනවා ද? | - | என்ன ? |
| මොකද? | - | என்ன ? |
| මොකට ද? | - | எதற்கு ? |
| ලැබෙයි ද? | - | கிடைக்குமா ? |
| කරන්නේ | - | செய்கிறீர்கள் |
| හාරන්නේ | - | தோன்றுகிறீர்கள் |
| හිටවනවා | - | நடுகின்றேன் |
| යුතුකම | - | கடமை |
| තේරෙන්නේ නෑ | - | புரியவில்லை |
| හොඳ නෑ | - | நல்லதல்ல |
| ප්‍රයෝජනයට ගන්න | - | பயன்பாட்டிற்கு எடுக்க |
| හිටවන්න ඕනෑ | - | நட வேண்டும் |
| ඉටු කරන්න ඕනෑ | - | செய்ய வேண்டும் |

## ක්‍රියාකාරකම 01

පින්තූර බලමු. කතන්දරය කියමු.

படத்தை அவதானிப்போம். கதை கூறுவோம்.



## ක්‍රියාකාරකම 02

**පිළිතුරු සොයමු. කියමු. ලියමු.**

விடையைத் தேடுவோம். சொல்வோம். எழுதுவோம்.

1. ළමයා අමතන්නේ කාට ද?
2. ඔහු වත්තේ කරමින් සිටියේ කුමක් ද?
3. ''තමන්ට ප්‍රයෝජනවත් නැති දෙයකට වෙහෙසෙන්නේ ඇයි?'' කියා ඇසුවේ කවුද?
4. අප අද කන්නේ කවුරුන් සිටුවූ ගස්වල ගෙඩි ද?
5. මේ පාඩමෙන් දෙන ආදර්ශය කුමක් ද?

## ක්‍රියාකාරකම 03

**පාඩමෙන් සොයමු. කියමු. ලියමු.**

பாடத்தில் தேடுவோம். சொல்வோம். எழுதுவோம்.

1. ''මම මගේ යුතුකමයි මේ ..............................................................''
2. ''වෙහෙසෙන්නේ ඇයි කියලා මට ....................................''
3. ''අපි ගස් ..............................................................................''
4. ''අද අපේ යුතුකම් ......................................................................''
5. ''එහෙම හිතන්න ................................................................. පුතේ''

## ක්‍රියාකාරකම 04

**පිළිතුරු තෝරමු. හිස්තැන් පුරවමු.**

விடையைத் தெரிவுசெய்வோம். இடைவெளி நிரப்புவோம்.

1. ............................ මුත්තේ හොයන්නේ?

   (මොනවා ද/මොක ද/කීය ද)

2. ඔයා බිම ඉඳගෙන ........................ කරන්නේ ?

   (ඇයි/මොක ද/මොකට ද)

3. සීයා බිම හාරන්නේ .......................... ?

   (ලැබෙයි ද/පුළුවන් ද/මොකට ද)

4. සීයේ ඔයා ඔය හැටි වෙහෙසෙන්නේ ...................... ?

   (ලැබෙයි ද/ඇයි/මොනවා ද)

5. එක අඹයක්වත් කන්න ............................. ?

   (ඇයි/මොකට ද/ලැබෙනවා ද)

## ක්‍රියාකාරකම 05

**ගීතය ගයමු. රස විඳිමු.**
*பாடலைப் பாடுவோம். இரசிப்போம்.*

මොනවද මුත්තේ මොකද කරන්නේ
මොකටද ඔබ ඔය බිම හාරන්නේ ....
ඔබටත් ළමයෝ නොපෙනේ නොසිතමි
අඹ ඇටයක් සිටුවන්නට හාරමි //

දුක සේ සිටුවා අඹ ඇටයක් අද
එක අඹයක් වත් කන්න ලැබේවි ද
මම ළමයෝ මින් අඹයක් නොපතමි
යුතුකම පමණක් ඉටු කොට තබනෙමි
තමන්ට නොලැබෙන දේකින් ලෝකෙට
කරන්ට හැකි දේ නොම තේරෙයි මට
පුදුමයි ළමයෝ ඔබෙ ඔය අදහස
හැදුණොත් ඔහොමට ඔබටම වෙයි දොස

පෙර උන් අය සිටවූ අඹ ගස්වල
ඵලයෙන් අප කවුරුත් ලබනෙමු ඵල
අපෙන් පසුව එන අයටත් එම ඵල
ලැබෙන්ට සැලසුම අපගේ යුතුකම
ඒ යුතුකම හොඳ හැටි දැන ගත්තෙමි
ආයුබෝවන් මුත්තේ මම යන්නෙමි //

ටිබෙට් ජාතික ඇස්. මහින්ද හිමි


2

# ඔසු උයන

සඳුනි, අන්න කෘෂිකර්මය සර් එනවා.

ආයුබෝවන් සර්!

ආයුබෝවන් දරුවනේ!



විදුහල්පතිතුමා රුක් රෝපණ සතිය ගැන කිව්වා නේද?
ඔව් සර්
ඔයාලා මොනවා ද ඒ වෙනුවෙන් කරන්නේ?
සර්, අපි පැළ හිටවනවා.
හොඳයි මොන පැළ වර්ග ද හිටවන්නේ?
අපිට ප්‍රයෝජනවත් පැළ.
අපේ පාසල් වත්තේ මල් ගස් තියෙනවා.
පලතුරු ගස් තියෙනවා. එළවළු පාත්තිත් තියෙනවා.
බෙහෙත් පැළ වර්ග තමයි නැත්තේ.
හොඳයි එහෙනම් අපි ඔසු උයනක් හදමු.
හොඳයි සර්
කොහොම ද අපි සංවිධානය කරන්නේ?
ගෙවල්වල විවිධ පැළ වර්ග තියෙනවා සර්. ඒවා එකතු කරමු.
අනෙක් ළමයින්ටත් බෙහෙත් පැළ ගේන්න භාර දෙමු.
ආ...... ඒක හොඳයි.
අපි ඔසු උයන හදන්නේ කොහේ ද සර්?
අර ළිඳ ළඟ හොඳයි.
විදුහල්පතිතුමාට කියලා එතැන ඔසු උයන හදමු.
අපි එතැන පිරිසිදු කරමු. තණකොළ ගලවමු.
බිම කොටමු. පාත්ති හදමු.
කුණු රොඩු එකතු කරලා කොම්පෝස්ට් වළක් හදමු.
ඔසු පැළ හිටවමු. වතුර වක්කරමු.
ඔයාලා කැමති නම් වටේට වැටක් බඳින්නත් පුළුවන්.
ඒක හොඳයි සර්, එතකොට බෙහෙත් වැල් ජාති
වැට දිගේ යවන්න පුළුවන්.

කවුද වැට බඳින්නේ?

අපි වැට බඳින්නම්.

හොඳයි, ලබන සිකුරාදා හැමෝ ම එකතු වෙලා ඔසු උයන හදමු.

සමන් පිච්ච සඳුන් එඬරු මදටිය බෙලි බෝවිටියා
ඉරමුසු ගොටුකොළ රසකිඳ හීරැස්ස ඉරිවේරියා
සොයමු ගෙනෙමු හිටවමු වැටදිගට හාතාවාරියා
හදමු අපිත් ඔසු උයනක් කදිමට මේ බිමේයා

(මුණසිංහ එම්. ගමගේ)

# වචන මාලාව

| | | |
|---|---|---|
| විදුහල්පතිතුමා | - | அதிபர் |
| රුක් රෝපණය | - | மரம் நடுதல் |
| විවිධ පැළ වර්ග | - | பல வகையான செடிகள் |
| ගුරුතුමා | - | ஆசிரியர் |
| පැළ හිටවනවා | - | மரம் நடுகிறோம் |
| ඔසු උයනක් | - | மூலிகைத் தோட்டம் |
| එකතු කරමු | - | ஒன்று சேர்ப்போம் |
| වතුර වක්කරමු | - | தண்ணீர் ஊற்றுவோம் |
| සංවිධානය කරමු | - | ஏற்பாடு செய்வோம் |
| කොම්පෝස්ට් වළක් | - | கூட்டெருக் குழி |
| ඔයා ගේන්න | - | நீங்கள் கொண்டு வாருங்கள் |
| මම ගේන්නම් | - | நான் கொண்டு வருகிறேன் |
| අපි ගේන්නම් | - | நாங்கள் கொண்டு வருகிறோம் |
| බෙහෙත් පැළ /වැල් | - | மருந்துச் செடிகள் / கொடிகள் |
| පිරිසිදු කරමු | - | சுத்தம் செய்வோம் |
| අපි භාර දෙමු | - | நாங்கள் ஒப்படைப்போம் |
| වැට බඳින්නම් | - | வேலி அமைக்கிறோம் |

## ක්‍රියාකාරකම 01

**පාඩමෙන් සොයා පිළිතුරු කියන්න.**

*பாடத்தில் தேடி விடை கூறுங்கள்.*

1. පාසල් වත්තේ ඇති ගස් වර්ග මොනවා ද?
2. ඔසු උයන සකස් කරන්නේ ඇයි?
3. ඔසු උයන හදන්නේ කොහේ ද?
4. වැට දිගේ යවන්නේ මොනවා ද?
5. කොම්පෝස්ට් වළ හදන්නේ කෙසේ ද?

## ක්‍රියාකාරකම 02

**පින්තූරය බලා වාක්‍ය කියමු. ලියමු.**

*படத்தைப் பார்த்து வாக்கியம் கூறுவோம். எழுதுவோம்.*



## ක්‍රියාකාරකම 03

**හිස්තැනට සුදුසු අකුර තෝරන්න. ලියන්න.**

*இடைவெளிக்குப் பொருத்தமான எழுத்தை தேடுங்கள். எழுதுங்கள்.*

1. කෘ ..... කර්මය
2. විදු ..... ල්පතිතුමා
3. රුක් රෝප ..... සතිය
4. බෙහෙත් පැ .....
5. සංවි ..... නය

## ක්‍රියාකාරකම 04

**වාක්‍ය අනුපිළිවෙළට ගළපමු. ලියමු.**

*வாக்கியங்களை ஒழுங்குபடுத்துவோம். எழுதுவோம்.*

පැළ වර්ග හිටවමු.

ගෙවත්ත පිරිසිදු කරමු.

වතුර වක්කරමු.

වැටක් බඳිමු.

පාත්ති හදමු.

පොහොර දමමු.

සිකුරාදා හැමෝම එකතු වෙමු.

කුණු රොඩු එකතු කරමු.

1. සිකුරාදා හැමෝම එකතු වෙමු.
2. ......................................................
3. ......................................................
4. වැටක් බඳිමු.
5. ......................................................
6. ......................................................
7. වතුර වක්කරමු.
8. ......................................................

## ක්‍රියාකාරකම 05

- බෙහෙත් පැළෑටි වර්ග පහක් කියන්න. අභ්‍යාස පොතේ ලියන්න.
  மருந்துச் செடிவகைகள் ஐந்தைக் கூறுங்கள். அவற்றைப் பயிற்சிப் புத்தகத்தில் எழுதுங்கள்.

- ඔසු උයනකින් අපිට ලැබෙන ප්‍රයෝජන සාකච්ඡා කරන්න. එයින් කිහිපයක් ඔබේ අභ්‍යාස පොතේ ලියන්න.
  மூலிகைத் தோட்டத்தினால் எமக்குக் கிடைக்கும் நன்மைகளைக் கலந்துரையாடுங்கள். அவற்றுள் சிலவற்றை உங்களது பயிற்சிப் புத்தகத்தில் எழுதுங்கள்.

# 3

# අධ්‍යාපන චාරිකාව

**(බසය පාසල ළඟ නවතා තිබුණි. හැමෝ ම එතැනට පැමිණ සිටියහ. බසයට නගින්නට පෙර විදුහල්පතිතුමා කතා කළේ ය.)**

ළමයි හැමෝ ම ඇවිල්ලා නේද?


ඔව් සර්.

දෙමවුපියන් දැනුවත් කළා ද?

ඔව් සර්.

අපි යන්නේ කොහේ ද කියලා දන්නවා ද? ළමයි!

අනුරාධපුරේ ...



බස් එක පිටත්වෙන වේලාවයි, පැමිණෙන වේලාවයි
දෙමවුපියන්ට කීවා ද?
ඔව් සර්.
ළමයි හැමෝ ම බස් එකට නගින්න ඉස්සර වෙලා
හොඳට මේ ටික අහගන්න.
නරඹන ස්ථාන ඇතුළත් සටහන ළඟ තියාගන්න.
නරඹන ස්ථාන ගැන විශේෂ තොරතුරු ලියා ගන්න.
ගැහැනු ළමයි, පිරිමි ළමයි වෙන වෙන ම යන්න ඕන.
දෙන්නා දෙන්නා පේළියට ගමන් කරන්න.
ඒ වගේ ම බෝ මළුවට, විහාරයට, වෙහෙර මළුවට ඇතුළු වෙද්දී
සෙරෙප්පු, හිස් වැසුම් ගලවන්න ඕන.
ඔයාලගෙ කෑම බීම, වතුර බෝතල්, බෑග් එකක දාගන්න.
තෙල්, මල්, පහන් පූජා කරන්න.
හැබැයි බුදු පිළිම අල්ලන්න එපා.
ඔන්න ළමයි සියලු දෙනා ම
මෙම චාරිකාව පිළිබඳ තොරතුරු
හෙට පන්තියේ දී ඉදිරිපත් කරන්න ඕනෑ.

****

## (පසු දින)

අද හැමෝ ම ඇවිල්ලා නේද?
කොහොම ද පුතාලගෙ චාරිකාව? ඔයාලා සතුටු වුණා ද?
ඔව් සර් අපට ගොඩාක් සතුටුයි.
අද ඔයාලා අධ්‍යාපන චාරිකාවේ දී දැකපු දේවල්
කියන්න ඕනෑ.

කවුද මුලින් ම විස්තර කියන්නේ?

මම කියන්නම්.... සර්.

ආ ... සුරේෂ්, ඔයා කියන්න.

"හැමෝට ම ආයුබෝවන්

මට අද හරි ම සතුටු දවසක්.

මම ඊයේ තමා පළමු වතාවට අනුරාධපුරේ ගියේ.

ඒ ගමනේ දී හුඟක් දේවල් දැක්කා.

අවුකන, විජිතපුර, කුට්ටම් පොකුණ, ඉසුරුමුණියටත් ගියා.

අහලා තිබුණාට දැක්කේ මුල් වතාවට.

පැරණි කලා නිර්මාණ දැක්කම

හරි ආඩම්බරයක් දැනෙනවා.

ආයෙත් යන්න ආසයි. "



බොහෝ ම හොඳයි.

හැමෝ ම අත්පොළොසන් දෙන්න සුරේෂ්ට.

දැන්, දේවි දුව කියන්න බලන්න.

ඔයාට මේ චාරිකාව ගැන

මොනවා ද හිතෙන්නේ?



"හැමෝට ම සුබ උදෑසනක්!

මට හරි ම සතුටුයි. මේ ගමන ගැන. මං දැක්ක දේවල්වලින් ගොඩක් ම කැමති සමාධි පිළිමයට. පිළිමය දැක්කාම හිතයි ගතයි දෙක ම නිවෙනවා. මොන පැත්තෙන් බැලුවත් මං දැක්කේ බුදුහාමුදුරුවෝ මා දිහා බලන් ඉන්නවා වාගේ. අපේ රටේ කලාකරුවෝ හරි ම දක්ෂයි. රුවන්මැලි සෑය, ශ්‍රී මහා බෝධිය ළඟ ඕන තරම් වෙලාවක් ඉන්න පුළුවන්. ශ්‍රී මහා බෝධිය ළඟ පුදුම සිසිලසක් දැනෙනවා. බෝපත්වල සිලි සිලි සද්දෙටත් මං ගොඩක් ආසයි. ආයෙත් දවසක් මට අනුරාධපුරේ යන්න ආසයි"

# වචන මාලාව

| | |
|---|---|
| පිටත් වන වේලාව/පැමිණෙන වේලාව | - புறப்படும் நேரம் / வருகை தரும் நேரம் |
| නරඹන ස්ථාන | - பார்வையிடும் இடங்கள் |
| ආහාර | - உணவு |
| කෑම | - சாப்பாடு |
| වතුර බෝතල් | - தண்ணீர்ப் போத்தல் |
| බෑග් | - பை |
| ගුරුවරු | - ஆசிரியர்கள் |
| දෙමවුපියෝ | - பெற்றோர் |
| වාහන | - வாகனங்கள் |
| ගැහැනු ළමයි | - பெண் பிள்ளைகள் |
| පිරිමි ළමයි | - ஆண் பிள்ளைகள் |
| ඒ පැත්තෙ | - அந்தப் பக்கம் |
| මේ පැත්තෙ | - இந்தப் பக்கம் |
| දෙන්නා දෙන්නා ගමන් කරන්න | - இருவர் இருவராக பயணம் செய்யுங்கள் |
| නරඹන ස්ථාන ඇතුළත් සටහන | - பார்வையிடும் இடங்கள் அடங்கிய குறிப்பு |

| | |
|---|---|
| තොරතුරු ලියා ගන්න | - தகவல்களை எழுதிக் கொள்ளுங்கள் |
| වාර්තාව සකස් කරන්න | - அறிக்கை தயாரித்துக் கொள்ளுங்கள் |
| බුදු හාමුදුරුවෝ | - புத்த பெருமான் |
| රුවන්මැලි සෑය | - ருவன்வெலிசாய |
| ශ්‍රී මහා බෝධිය | - ஸ்ரீ மகா போதி |
| සිසිලස | - குளிர் |
| සෙරෙප්පු | - செருப்பு |
| හිස්වැසුම් | - தலைக் கவசம் |
| ගලවන්න ඕන | - கழட்ட வேண்டும் |
| තෙල් | - எண்ணெய் |
| මල් | - பூக்கள் |
| පහන් | - விளக்கு |
| අල්ලන්න එපා | - தொட வேண்டாம் |

## ක්‍රියාකාරකම 01

අකුරු ගළපමු. කියමු. ලියමු.

விடையை இணைப்போம். கூறுவோம். எழுதுவோம்.



ටම්කුට් කුණපො

....................................




මාසධියළිපිම

....................................




සැරුැන්වලිමැය

....................................



සුණිමුයඉරු

....................................



කඅනවු මළිපිය

....................................

## ක්‍රියාකාරකම 02

**උදාහරණය බලා වාක්‍ය සම්පූර්ණ කරමු.**

உதாரணத்தை அவதானித்து வாக்கியத்தைப் பூரணப்படுத்துவோம்.

| උදාහරණ:- ළමයි සපත්තු ගලවනවා. | ළමයි සපත්තු ගැලෙව්වා. |
|---|---|
| අපි අනුරාධපුරේ යනවා. | අපි අනුරාධපුරේ ................................ |
| අපි ඉසුරුමුණිය නරඹනවා. | අපි ඉසුරුමුණිය ................................ |
| හැමෝම රුවන්මැලි සෑය වඳිනවා. | හැමෝම රුවන්මැලි සෑය ................ |
| විහාරයට මල් පූජා කරනවා. | විහාරයට මල් පූජා ............................ |
| අපි සමාධි පිළිමය බලනවා. | අපි සමාධි පිළිමය ............................ |

## ක්‍රියාකාරකම 03

**පාඩමේ ඇතුළත් උපදෙස් සොයමු. ලියමු.**

பாடத்தில் உள்ள அறிவுறுத்தல்களைத் தேடுவோம். எழுதுவோம்.

1. ..............................................................
2. ..............................................................
3. ..............................................................
4. ..............................................................
5. ..............................................................

## ක්‍රියාකාරකම 04

**පාඩම කියවමු. පිළිතුරු ලියමු.**

*பாடத்தை வாசிப்போம். விடை எழுதுவோம்.*

1. අධ්‍යාපන චාරිකාව ගියේ කොහාට ද? ..................................................
2. සිසිලසක් දැනෙන්නේ කොතැන සිටින විට ද? ......................................
3. පාඩමේ ඇතුළත් පූජනීය ස්ථාන තුනක් ලියන්න. ................................
4. සුරේෂ්ගේ සිතට ආඩම්බරයක් දැනුණේ ඇයි?.........................................
5. දේවි දුටු දේවල්වලින් වඩාත් කැමති කුමකට ද? .....................................

## ක්‍රියාකාරකම 05

**ඔබ ගිය චාරිකාවක් ගැන විස්තර පන්තියට කියන්න. වාක්‍ය පහක් ලියන්න.**

*நீங்கள் சென்ற சுற்றுலா பற்றிய விபரங்களை வகுப்பறையில் கூறுங்கள். 5 வாக்கியங்கள் எழுதுங்கள்.*

1. ..................................................................
2. ..................................................................
3. ..................................................................
4. ..................................................................
5. ..................................................................

# 4

# බස් එක එන තුරු

මාමේ, උයන්වත්තට යන බස් එක නවත්වන්නේ කොහේ ද?

පුතේ, මාත් හරියට දන්නේ නැහැ.

අර බස් එකේ ඉන්න **රියදුරු මහත්මයාගෙන්** අහලා බලන්න.

හොඳයි මාමේ.

අජිත්, අන්න, අර ඩ්‍රයිවර් මාමා බැහැලා යනවා.

අර ඉන්නේ **කොන්දොස්තර මහත්මයා**

එයාගෙන් අහලා බලමු.

මාමේ උයන්වත්තට යන බස් එක ...?



ආ ... ඒ බස් එක නවත්වන්නේ

එහා පැත්තේ කෙළවරේ.

ඒක යන්නේ කීයට ද?

ඒක යන්නේ

දෙකයි හතළිස් පහට

හැබැයි බස් එක නං තාම

ඇවිල්ලා නැහැ.

එන්නේ කීයට **විතර** ද?

මෙහාට එනකොට දෙක හමාර

විතර වෙනවා.

උයන්වත්තේ ඉඳලා ආපහු එන්නේ

කීයට ද මාමේ?

**සවස හතරයි තිහට**

බොහොම ස්තුතියි මාමේ.

රමේෂ්, බස් එක කීයට ද එනවා කිව්වේ?

දෙක හමාරට එනවාලු.

අන්න අන්න අජිත් මොකක් ද තරගයක්.



**කරුණාවෙන් සවන් දෙන්න!**

මේ ඔබ අමතන්නේ

මල්ලවපිටිය ක්‍රීඩා සමාජයේ ප්‍රචාරක අංශයයි.

විවෘත බයිසිකල් ධාවන තරගය දැන් **ආරම්භ වුණා.**

**පළමු ස්ථානය** සඳහා අලුත් ම යතුරු පැදියක්.

**දෙවන හා තුන්වන ස්ථාන** සඳහා පා පැදි හා මුදලින් තෑගි

සියලු ම **තරගකරුවන්** සඳහා වටිනා **තෑගි පිරිනමනවා.**

හිතවතුනි, කරුණාකර **මාර්ගය අවහිර නොකරන්න.**

**මාර්ගය** දෙපසට වී ඉඩ දෙන්න. තරගකරුවන් දිරිමත් කරන්න.

රන්ජන්, අපිත් බයිසිකල් තරගය බලමු.

බලමු, බලමු. තව වේලාව තියෙනවා නේ බස් එකට

අන්න තරගකරුවෝ තුන්දෙනෙක් ළඟ ළඟ ම එනවා.

ඈතින් එක පොකුරට තව හත් අට දෙනෙක් ම එනවා.

බලන් ඉන්න හරිම ආසයි.

අජිත්, අන්න, අන්න උයන්වත්ත බස් එක එනවා.

දැන් අපි යමු.

හා හොඳයි ඉක්මනට යමු.

# වචන මාලාව

| | | |
|---|---|---|
| සවස හතරයි තිහ | - | மாலை நான்கு முப்பது |
| ඒකේ | - | அதில் |
| මේකෙ | - | இதில் |
| එනවාලු | - | வருமாம் |
| යන්නේ කීයට ද? | - | எத்தனை மணிக்கு போகும் |
| විතර | - | அளவில் |
| බස් එක | - | பஸ் வண்டி |
| රියදුරු මහත්මයා | - | சாரதி |
| කොන්දොස්තර මහත්මයා | - | நடத்துனர் |
| සවස | - | மாலை |
| නිවේදනය | - | அறிவித்தல் |
| තරගකරුවන් | - | போட்டியாளர்கள் |
| විවෘත බයිසිකල් ධාවන තරගය | - | திறந்த சைக்கிள் ஓட்டப் போட்டி |
| නරඹන්නන් | - | பார்வையாளர்கள் |
| තෑගි පිරිනමනවා | - | பரிசு வழங்கப்படும் |
| සවන් දෙන්න | - | கேளுங்கள் |
| මාර්ගය අවහිර නොකරන්න | - | பாதையைத்தடை செய்யாதீர்கள் |
| ආරම්භ වුණා | - | ஆரம்பமானது |
| පළමු ස්ථානය | - | முதலாமிடம் |
| දෙවන, තුන්වන | - | இரண்டாமிடம், மூன்றாமிடம் |
| මාර්ගය දෙපස | - | வழியில் இரு புறமும் |
| ඉඩ දෙන්න | - | இடம் கொடுங்கள் |
| දිරිමත් කරන්න | - | உற்சாகப்படுத்துங்கள் |

## ක්‍රියාකාරකම 01

**පාඩම කියවා පිළිතුරු කියමු. ලියමු.**

*பாடத்தை வாசித்து விடை கூறுவோம். எழுதுவோம்.*

1. ළමයි සොයන බස් එක මොකක් ද? ................................................
2. තොරතුරු දැන ගත්තේ කාගෙන් ද? ................................
3. බස් එක එනවා කිව්වේ කීයට ද?..........................................................
4. පිටත් වන වේලාව කීය ද?..................................................................
5. ළමයි නැරඹූ තරගය කුමක් ද? .....................................
6. තරගයේ පළමු ස්ථානය සඳහා පිරිනමනු ලබන තෑග්ග කුමක් ද?............

## ක්‍රියාකාරකම 02

**වේලාව කියමු. අකුරින් ලියමු.**

*நேரத்தை கூறுவோம். எழுத்தில் எழுதுவோம்.*

1. හවස 4.30 ...............................................
2. ප.ව. 2.30 ...............................................
3. ප.ව. 2.45 ...............................................
4. පෙ.ව. 7.15 ...............................................
5. උදේ 10.20 ...............................................
6. රාත්‍රි 8.50 ...............................................
7. පාන්දර 4.00 ...............................................
8. දවල් 12.30 ...............................................

## ක්‍රියාකාරකම 03

වාක්‍ය දෙකක් සම්බන්ධ කර කියමු. ලියමු.

இரு வாக்கியங்களையும் இணைத்து கூறுவோம். எழுதுவோம்.

උදාහරණය:- මාර්ගය අවහිර නොකරන්න.

තරගකරුවන්ට ඉඩදෙන්න.

- <u>මාර්ගය අවහිර නොකර තරගකරුවන්ට ඉඩදෙන්න.</u>

(නිසා, ත්, සහ, දී, නමුත්)

1. පළමු ස්ථානයට යතුරු පැදියක්.
   දෙවන තුන්වන ස්ථානවලට මුදලින් තෑගි.

2. තරගකරුවන්ට සහතික පිරිනමනවා.
   තරගකරුවන්ට තෑගි පිරිනමනවා.

3. මාර්ගය දෙපස ඉඩ දෙන්න.
   තරගකරුවන් දිරිමත් කරන්න.

4. බස් එකට තව වෙලා තියෙනවා.
   අපි යමු තරගය බලන්න.

5. බස් එක යන්නේ දෙකයි හතළිස් පහට.
   බස් එක තවම ඇවිල්ලා නෑනේ.

## ක්‍රියාකාරකම 04

**තොරතුරු ගළපා නිවේදනය කියමු. ලියමු.**

**தகவல்களை ஒழுங்குபடுத்தி அறிவித்தலைக் கூறுவோம். எழுதுவோம்.**

" 2018 මාර්තු මස 25 වන දින

ඉරිදා

කරුණාවෙන් සවන් දෙන්න.

ප්‍රදේශවාසී ජනතාවට

රඹුක්කන සිට කැබැල්ලවත්ත තෙක්


අත්‍යවශ්‍ය අලුත්වැඩියා කටයුතු කරන බැවින්

ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රචාරක අංශයයි.

මෙයින් කාරුණික ව දැනුම් දෙමු.

විදුලි සැපයුම විසන්ධි කරන බව

මේ ඔබ අමතන්නේ "



## ක්‍රියාකාරකම 05

**මෙම වාක්‍ය සුදුසු පරිදි ගළපා කියමු. ලියමු.**

*பின்வரும் வாக்கியங்களைப் பொருத்தமாக இணைத்துக் கூறுவோம். எழுதுவோம்.*

**උදාහරණය:-** **තරගය ආරම්භ <u>වෙනවා.</u>**

**තරගය ආරම්භ <u>වුණා.</u>**

1. රියදුරු මාමා බැහැලා <u>යනවා.</u>
2. කොන්දොස්තර මහත්මයා <u>ඉන්නවා.</u>
3. තුන් දෙනෙක් ළඟ ළඟ ම <u>එනවා.</u>
4. බස් එක <u>නවත්වනවා.</u>
5. තරගකරුවන්ට තෑගි <u>දෙනවා.</u>

# 5

# වැඩිහිටියන්ට සලකමු

රාධා රාධා, අර බලන්න අර තාප්පේ ළඟ

ආච්චි කෙනෙක් වැටිලා ඉන්නවා නේද?

එන්න, එන්න. අපි උදවු කරමු.

ආච්චි ඇයි බිම ඉඳගෙන?

මට කැරකිල්ලක් හැදුණා, මම මෙතන ඉඳ ගත්තා පුතේ.

කමලි, ආච්චිට වතුර ටිකක් දෙන්න.

ආ මෙන්න ආච්චි, වතුර ටිකක් බොන්න.



ආච්චි කෑම කාලා ද?

තවම නෑ පුතේ.

උදේ මට බඩගින්නක් තිබුණේ නෑ.

ආච්චි ඉන්නේ කොහේ ද? වැඩිහිටි නිවාසයේ ද?

නෑ පුතේ, දුවලගෙ ගෙදර

මම වැඩිහිටි නිවාසයට යන්නෙ නැහැ.

මගේ දරුවෝ මට හොඳට සලකනවා.

කොහේ ද ආච්චි ගියේ?

මම වෙදමහත්තයා හම්බවෙන්න ගියා.

ආච්චි තනියම ද ආවේ?

නෑ පුතේ. දුවත් එක්ක.

දුව පාර එහා පැත්තේ තියෙන බෙහෙත් බඩු කඩේට ගියා.

ආච්චි ගියේ නැත්තේ ඇයි?

දුව මට එයා එනකම් මෙතැන ඉන්න කිවුවා.

මට කැරකිල්ලක් ආවා.

අපි උදවු කරන්නම්, ආච්චි නැගිටින්න.

අපි එහා පැත්තට යමු.

රාධා, ඔයා බෑග් එක ගන්න.

මම ආච්චි එක්කර ගෙන එන්නම්.

එන්න පාර මාරු වෙමු.

අර තියෙන්නේ බෙහෙත් බඩු කඩේ.

ආ..... අර ඉන්නේ මගේ දුව.

අනේ ... අම්මාට මොකද වුණේ?

නැන්දේ, ආච්චි අතන වැටිලා හිටියා.

ඉතිං අපි එක්කරගෙන ආවා.

බොහොම ස්තුතියි ඔයාලට

ආ මෙන්න ආච්චිගේ බෑග් එක.

පුතාලා යනවා ද?

ඔව් ආච්චි අපි යනවා.

පුතාලාට දෙවි පිහිටයි!

# වචන මාලාව

| | | |
|---|---|---|
| තාප්පේ ළඟ | - | மதில் அருகில் |
| බිම ඉඳගෙන | - | கீழே அமர்ந்து |
| කැරකිල්ලක් හැදුණා | - | தலைச்சுற்று ஏற்பட்டது |
| යන්න ඕන කොහොම ද? | - | எப்படிப் போக வேண்டும் |
| ඉන්නේ කොහේ ද? | - | எங்கே இருக்கிறீர்கள் |
| කෑම කාලා ද? | - | சாப்பிட்டீர்களா? |
| දරුවෝ ඉන්නවා ද? | - | பிள்ளைகள் இருக்கிறார்களா? |
| අපි උදවු කරන්නම් | - | நாங்கள் உதவி செய்கிறோம் |
| තනියම ද ආවේ | - | தனியாகவா வந்தீர்கள்? |
| ගියේ නැත්තේ ඇයි? | - | ஏன் போகவில்லை? |
| යනවා ද? | - | போகிறீர்களா? |
| යන්නේ නැහැ | - | போக மாட்டேன் |
| යන්නේ නැත්තේ ඇයි? | - | போகாதது ஏன் |
| මම යන්නේ නැහැ | - | நான் போக மாட்டேன் |
| බෑග් එක ගන්න | - | பையை எடுங்கள் |
| වැටිලා හිටියා | - | விழுந்து இருந்தார் |

## ක්‍රියාකාරකම 01

**පිළිතුරු කියමු. ලියමු.**

*விடையைக் கூறுவோம். எழுதுவோம்.*

1. ආච්චි බිම ඉඳගත්තේ ඇයි? ..............................................................................
2. ඇයට වතුර දුන්නේ කවුද? ..............................................................................
3. ආච්චි ගියේ කොහේ ද? ..............................................................................
4. ඇය ආවේ කා සමග ද? ..............................................................................
5. ආච්චිට හොඳට සලකන්නේ කවුරුන් ද? ..................................................

## ක්‍රියාකාරකම 02

**පාඩමෙන් වචන තෝරා ලියමු. කියවමු.**

*பாடத்திலிருந்து சொற்களைத் தெரிவுசெய்து எழுதுவோம். வாசிப்போம்.*

1. ආච්චි කෙනෙක් ............................ නේද?
2. ඇයි ......................... ඉඳගෙන.
3. ......................... කාලා ද?
4. ......................... ගියේ?
5. ආච්චි ......................... තනියම ද?
6. දැන් .......................... යන්නේ?
7. ආච්චි ............................ කොහේ ද?

## ක්‍රියාකාරකම 03

**ගැළපෙන අකුර යොදමු. කියමු.**

பொருத்தமான எழுத்தைத் தெரிவுசெய்து எழுதுவோம். கூறுவோம்.

1. පාර ..... ලන්න (බ/ප)
2. අතන තා ..... පය (ප්/බ්)
3. ..... ම ඉඳගත්තා. (බි/පි)
4. එහා ..... ත්තට ගියා. (බැ/පැ)
5. වතුර ටිකක් ..... න්න. (බො/පො)
6. ..... හෙත් ටිකක් ගන්න. (පෙ/බෙ)

## ක්‍රියාකාරකම 04

**උදාහරණය බලා කියමු. ලියමු.**

உதாரணத்தை அவதானித்துக் கூறுவோம். எழுதுவோம்.

**උදාහරණය:-** **ආච්චි තනියම ආවේ නැහැ.**

**ආච්චි තනියම ආවේ නැත්තේ ඇයි?**

1. අපි උදව් කරන්නේ නැහැ .......................................................................
2. ආච්චි වතුර බොන්නේ නැහැ ...................................................................
3. මට බඩගින්නක් තිබුණේ නැහැ ...............................................................
4. ආච්චි වැඩිහිටි නිවාසයට යන්නේ නැහැ ..................................................
5. බෙහෙත් බඩු කඩේට ගියේ නැහැ ..........................................................

## ක්‍රියාකාරකම 05

චිත්‍රය බලා දෙබස් තෝරා කියමු. ලියමු.

சித்திரத்தை அவதானித்து உரையாடலை தெரிவுசெய்து கூறுவோம். எழுதுவோம்.



| | |
|---|---|
| මල්ලී ඉන්නේ මොන පන්තියේ ද? | හොඳයි අයියේ මම පන්තියට ගිහින් කෑම කන්නම්. |
| මල්ලී උදේට කෑම කාලා ද? | 8 ඒ පන්තියේ. |
| මල්ලී ඇයි බිම ඉඳගෙන? | බොහොම ස්තුතියි අයියේ. |
| ඉක්මනට වතුර ටිකක් ගේන්න. ආ.... මල්ලී මෙන්න වතුර බොන්න. | මට කැරකිල්ලක් හැදුණා. මම මෙතන ඉඳගත්තා. |
| එන්න. අපි ඔයාව පන්තියට එක්ක යන්නම්. | කෑවේ නෑ අයියේ, කෑම ගෙනාවා. |

# 6

# නරිබෑනා

**(දයානන්ද ගුණවර්ධන මහතාගේ නරිබෑනා නාට්‍යයේ කොටසක් ඇසුරින් සකස් කළ පාඩමකි.)**

ගම ගෙදරක් අසල කැලෑවක නරියෙක් ජීවත් වෙයි. ගම මව, ගම දුව සමග දර කැඩීම සඳහා කැලෑවට පැමිණෙයි. ගම දුව කැලෑවේ ලස්සන බලමින් කාලය ගත කරයි. පරිසරයේ සුන්දර බව අත්විඳියි.



ඇහැළ මලින් ගස් පිරිලා
බලන්න හරි ලස්සනයි
අඹ, රඹුටන්, ජම්බු ඉදිලා
අද හැම තැන හරි හැඩයි

දොඹ ගස් යට මල් හැලිලා
සුවඳත් හැම තැන දැනෙයි
වලිකුකුළන් හඬලන කොට
අහං ඉන්න හරි හිතයි

ගස්වල දලු නැළවෙන කොට
ඇඟට හරිම සීතලයි
ඉගිළෙන අර සමනලයින්
අල්ලන්නට බැරි හැඩයි

දයානන්ද ගුණවර්ධන

ඔහොම හැඳුණොත් උඹ දෙන්න වෙන්නේ නරියෙකුට යැයි මව පවසයි. නරියාට එය ඇසෙයි. පසුව නරියා ඇවිත් පොරොන්දුව ඉටු කරන ලෙස ඇවිටිලි කරයි.

ඉන් පසු නරියා ගම දුව රැගෙන සිය නිවෙස බලා පිටත් වෙයි. ඇයට නරියා සැනසිලි බස් කියයි.

නරියා :- කුමට ද සොබනියෙ කඳුළු සලන්නේ
හේතුව මම නොදනිම්
ගිරිහෙල් අරඹේ ඇති මගෙ නිවසට
මම ඔබ ගෙන යන්නම්
ඔබ හට හැම සැප එහි දෙන්නම්

(නරියා ගම දුව රැගෙන ඈත වනයට යයි.)

නරියා :- දැන් ඉතිං ඔහොම කනගාටුවෙන් ඉන්න එපා.
මොකක් ද ඉතිං කනගාටුවෙන් ඉන්න තියෙන හේතුව?

(මේ අතර පැමිණි අය පිටත සිට)

නරි බෑනෝ මේ අහන්න
දෑවැද්දත් අරං මෙන්න
අපි ආවා දූ බලන්න
ගෙට එන්නට දොර අරින්න

නරි බෑනා මාමා, නැන්දා පිළිගනියි. ගෙට එක්කරගෙන එයි. ආ ගිය තොරතුරු විමසයි. සියලු දෙනා ම කතා බහ කරමින් සිටිති. ඉන්පසු කෑම බීමවලින් සංග්‍රහ කරයි.

ගමරාල :- අපි ඉතා ඕනෑකමින් මේ ගමන ආවේ
දෑවැද්දත් අරගෙන.
දෑවැද්දක් නැතුව දීගයක් දෙන්න බෑ.

නරියා :- අනේ, කොච්චර එකක් ද?
දුවට ලැබෙන දෑවැද්ද කොච්චර උතුම් එකක් ද?
මං මාමේ, දෑවැද්දට දෙන්නේ මොනවා ද කියලා
ඇහුවෙවත් නෑ.

ගම මහගේ :- අනේ මෙහෙම බෑනා කෙනෙක් හම්බ වෙච්ච එක
කොච්චර එකක් ද?

නරියා :- මෙහෙම නැන්දලා, මාමලා හම්බ වෙච්ච එක කොච්චර
වාසනාවක් ද?

කපුරාල :- අපි ඒක ගෙනත් එළියෙන් තිබ්බා.
හරි අමාරුවෙන් ගෙනාවේ.
මහා බර පෙට්ටියක්.

නරියා :- හුඟාක් බරට දේවල් ඇති.
හුඟාක් වටින දේවල් ඇති.

(ගම හාමිනේ අමාරුවෙන් පෙට්ටිය ගෙට ගෙන ඒමට සැරසෙයි.)

නරියා :- පිස්සු ද නැන්දේ, මෙන්න මෙහාට වෙන්න කෝ.
මම ගේන්න ඒ පෙට්ටිය.

(නරියා පෙට්ටිය ඇර බැලීමට සැරසෙයි.)

ගමරාල :- එහෙනං මෙන්න බෑනෝ යතුර

(සියලු දෙනාම බලා සිටිති. නරියා යතුරෙන් පෙට්ටිය අරී. සැණෙකින් නරියා යටිගිරියෙන් හූ කියමින් වේගයෙන් දුවයි. බල්ලෙක් ඔහු පසු පස ලුහු බඳී.)

(ගමරාල පැන බල්ලා අල්ලා ගනී.)

මගෙ බුදු නැන්දේ මගෙ බුදු මාමේ
බල්ලව නං අනෙ අත නාරින්නේ
දූවත් අරගෙන යන්නට යන්නේ
අපගේ නෑකං අතහැර ගන්නේ
මිනිසුන් තිරිසන් නෑ ගැළපෙන්නේ

# වචන මාලාව

| | | |
|---|---|---|
| ඇහැළ මල් | - | கொண்டல் பூ |
| ගස් | - | மரங்கள் |
| අඹ | - | மாம்பழம் |
| රඹුටන් | - | றம்புட்டான் |
| ජම්බු | - | ஜம்பு |
| දොඹ ගස් | - | தொம்ப மரம் |
| වලි කුකුළන් | - | காட்டுக் கோழிகள் |
| සමනලයන් | - | வண்ணத்துப் பூச்சிகள் |
| හඬලන | - | கூவுதல் |
| සුවඳ | - | மணம் |
| නැළවෙන | - | அசைதல் |
| ඇඟට | - | உடம்புக்கு |
| ඉගිළෙන | - | பறக்கின்ற |
| නරියා | - | நரி |
| බෑනා | - | மருமகன் |
| දෑවැද්ද | - | வரதட்சணை |
| මාමා | - | மாமா |
| නැන්දා | - | மாமி |
| දීගය | - | திருமணம் |
| කොච්චර | - | எவ்வளவு |
| පෙට්ටිය | - | பெட்டி |
| අමාරුවෙන් | - | கஷ்டத்தோடு |
| බල්ලා | - | நாய் |
| ගම මහගේ | - | வீட்டுக்காரி (கமராலயின் மனைவி) |
| ගමරාල | - | கமராால |
| යටිගිරියෙන් | - | அடித் தொண்டையால் |

## ක්‍රියාකාරකම 01

**පිළිතුරු කියමු. ලියමු.**

விடையைக் கூறுவோம். எழுதுவோம்.

1. ගීතයේ ඇතුළත් ගස්වල නම් ලියන්න.
2. මල් හැලිලා ඇත්තේ කොහේ ද?
3. ''අහං ඉන්න හරි හිතයි'' කියන්නේ මොකක් ද?
4. ගම දුව කැලයට රැගෙන ගියේ කවුද?
5. පෙට්ටියේ තිබුණේ මොනවා ද?

## ක්‍රියාකාරකම 02

**පින්තූරය ගළපමු. කියමු. ලියමු.**

படத்தைத் தொடர்புபடுத்திக் கூறுவோம். எழுதுவோம்.

1. ඇහැළ මලින්  ...................... පිරිලා.

2.  ...................... , රඹුටන්, ජම්බු ඉදිලා.

3. දොඹ ගස් යට  ................. හැලිලා.

4.  ............................. හඬලනවා.

5. නරියා  .....................රැගෙන ඇත වනයට යයි.

6.  ............................. වේගයෙන් දුවයි.

## ක්‍රියාකාරකම 03

**සොයමු. ගළපමු. කියමු. ලියමු.**

தேடுவோம். பொருத்தமான சொல்லை இணைப்போம். கூறுவோம். எழுதுவோம்.

හරි හැඩයි - ...බොහොම ලස්සනයි...................

හඬලන කොට - ...............................................

දලු නැළවෙන කොට - ...............................................

කඳුළු සලන්නේ - ...............................................

දෑවැද්ද - ...............................................

හම්බ වෙච්ච - ...............................................

නෑ ගැළපෙන්නේ - ...............................................

(අඬන්නේ, හමුවූ, තෑගි බෝග, සුදුසු නෑ, දලු සෙලවෙන විට, බොහොම ලස්සනයි, අඬන කොට)

## ක්‍රියාකාරකම 04


**මෙම නාට්‍යයේ ඔබ සිත්ගත් අවස්ථා කියන්න. ලියන්න.**

இந்த நாடகத்தில் உங்களைக் கவர்ந்த சந்தர்ப்பத்தைக் கூறுங்கள். எழுதுங்கள்.

## ක්‍රියාකාරකම 05

රූප බලමු. කියමු. හිස්තැන් පුරවමු.

படங்களைப் பார்ப்போம். கூறுவோம். இடைவெளி நிரப்புவோம்.







ඹු



ඹ







ළ



ළ



ළා

(රඹුටන්, කිඹුලා, කඹය, ඇහැළ, කළය, ළමයා, වලිකුකුළා, බළලා)

# 7

# ලෑලි පාලම

(සම්පත්, නිසාම්, එරංග හොඳ යාළුවෝ. මේ අය හැමදාම හවස සෙල්ලම් කරලා ඔයට නාන්න යනවා. එදත් මේ අය නාලා ගොඩට ආවා.)

සම්පත් බලා ගෙන. ඕක අල්ලන්න එපා!

ඇයි ඒ?

ඔය **අත්වැට දිරලා.**

ඔව් එරංග, **ලෑලිත්** සෑහෙන්න දිරලා වගේ.

යටලීත් එකක් දෙකක් **කැඩිලා.**

නිසාම්, පාලම **පරණයි** නේ.

ගංවතුරට පාලම තවත් අබලන් වෙලා.

ඔව් සම්පත්, අපි පාලම **අලුතෙන් හදමු.**

**යාළුවෝ ඔක්කොට ම එන්න කියමු.**

අන්න ජනක මාමායි, අන්සාර් මාමායි එනවා.

ළමයි බර කතාවක් වගේ.

ඔව් අන්සාර් මාමේ, අපි මේ කතා කළේ

මේ පාලම අලුත්වැඩියා කරමු කියලා.

ඒක හොඳයි.

ගමේ පොදු වැඩවලට ළමයි **එකතු වෙනවා** නම් කොච්චර හොඳ ද?

අපේ ගෙදරත් ඇති කිතුල් ලී. ඒවා යටලීවලට හොඳයි.

තව ඕන නං මෝරපු ගහකුත් තියෙනවා. කපලා දෙන්නං.

ලොකු උදව්වක් ජනක මාමේ.



ඕන කරන ලෑලි ටික මම දෙන්නම් ජනක මල්ලී.
අපේ ගමේ වැඩ අපි ම එකතු වෙලා කරන්න ඕන.
එහෙම නේද අන්සාර් අයියේ?

නැතුව? ගමේ වැඩේ නේ.

මාමේ එතකොට ... මොනවාද අවශ්‍ය උපකරණ?

අපේ ගෙදර **කියතක්** තියෙනවා.

මං ඒක ගේන්නම්.

මට පුළුවන් **අඬුමිටියක්** ගේන්න නිසාම්.

**ලණු** නං ඕන තරම් තිබුණා අපේ ගෙදර.

මම ගේන්නම් අන්සාර් අයියේ.

ආ.... **ඇණ**

මාමේ, අවශ්‍ය කරන **ඇණ** අපේ සීයාගේ කඩෙන් ගන්න පුළුවන්.

හොඳයි එරංග පුතා.

එහෙනං, ජනක මාමේ, පාලම හදන්නේ **කවදා** ද?

ලබන **සෙනසුරාදා** හොඳයි නේ ද අන්සාර් අයියේ?

හොඳයි, ජනක මල්ලී, ගමේ අනෙක් අයටත් එන්න කියමු.

උදේ දහයට විතර තේ එකක් දුන්නොත් හොඳයි නේ ද,

අන්සාර් අයියේ?

ඒක මම සූදානම් කරන්නම්. කැවුම් ටිකකුත් ගේන්නම්.

ඒක හොඳයි.

එහෙනං, හරි නේද පුතාලා?

හොඳයි මාමේ, අපි ගිහිං එන්නම්.

**සෙනසුරාදා** උදේ අටට හැමෝම එන්න.

ලී පාලම | දිරාලා
අත්වැට ඇත | කැඩීලා
සමගි දමින් | බැඳීලා
හදමු අපිත් | එක්වෙලා

# වචන මාලාව

ලී - கட்டைகள்
ලෑලි - பலகை
ඇණ - ஆணி
අඬු මිටිය - சுத்தியல்
ලණු - கயிறு
අත්වැට - கைப்பிடி
කියත - வாள்
කැඩිලා - உடைந்து
දිරලා - இத்து
පරණයි - பழையது
උපකරණ - உபகரணம்
ඔක්කොට ම එන්න කියමු - அனைவரையும் வரச் சொல்லுவோம்

| | | |
|---|---|---|
| අලුතෙන් හදමු | - | புதிதாகச் செய்வோம் |
| යාළුවෝ | - | நண்பர்கள் |
| එකතු වෙනවා | - | ஒன்று கூடுதல் |
| එකතු වුණා | - | ஒன்று சேர்ந்தார்கள் |
| කවදා ද | - | எப்பொழுது |
| ලෑලි ගේන්නම් | - | பலகை கொண்டு வருகிறேன் |
| සෙනසුරාදා උදේ | - | சனிக்கிழமை காலை |
| දහයට විතර | - | பத்து மணி அளவில் |
| කැවුම් | - | பலகாரம் |

## ක්‍රියාකාරකම 01

**පිළිතුරු කියමු. ලියමු.**

விடையைக் கூறுவோம். எழுதுவோம்.

1. ළමයි සාකච්ඡා කළේ කුමක් ගැන ද? ....................................................
2. අවශ්‍ය කරන ලෑලි දෙන බව කීවේ කවුද? ......................................
3. සංග්‍රහ කටයුතු භාර ගත්තේ කවුද? ................................................
4. සීයාගේ කඩෙන් ගන්න පුළුවන් කිව්වේ මොනවා ද? ...........................
5. පාඩමේ සඳහන් උපකරණ දෙකක් නම් කරන්න.

   1. ............................................ 2. ..............................................

## ක්‍රියාකාරකම 02

**සුදුසු සමාන වචනය පාඩමෙන් සොයා කියමු. ලියමු.**

பொருத்தமான சொல்லை பாடத்திலிருந்து தேடிக் கூறுவோம். எழுதுவோம்.

උදා:- **මිත්‍රයෝ - යහළුවෝ**

1. ක්‍රීඩා - ..................................
2. නිවස - ..................................
3. ග්‍රාමය - ..................................
4. පෙරවරු - ..................................
5. විශාල - ..................................

(ගෙදර, සෙල්ලම්, ගම, උදේ, ලොකු)

## ක්‍රියාකාරකම 03

බහු වචන කියමු. ලියමු.

பன்மைச் சொற்களைக் கூறுவோம். எழுதுவோம்.

උදාහරණ :- යාළුවා - යහළුවෝ

1. ළමයා - ..................................
2. ලීය - ..................................
3. පාලම - ..................................
4. ලෑල්ල - ..................................
5. කියත - ..................................
6. අඩුමිටිය - ..................................
7. ලණුව - ..................................
8. ඇණය - ..................................
9. අයියා - ..................................
10. පාර - ..................................

## ක්‍රියාකාරකම 04

උදාහරණය බලා ප්‍රශ්න අහමු.

உதாரணத்தை அவதானித்து வினாக்களை வினவுவோம்.

උදාහරණ :- ඇණ ගේන්නේ කවුද? ඇණ ගේන්නේ එරංග

1. ................................ කොහෙන් ද? එරංග ඇණ ගෙනාවේ සීයාගේ කඩෙන්
2. ................................ ඇයි? පාලම වඩාත් අබලන් වුණේ ගංවතුර නිසා.
3. ............................කීයට ද? වැඩ කරන අයට තේ දෙන්නේ උදේ දහයට
4. ..............................කොහේ ද? රැස්වීම පැවැත්වෙන්නේ ප්‍රධාන ශාලාවේ
5. ................................ කවදා ද? අපි කොළඹ යන්නේ ලබන සඳුදා

## ක්‍රියාකාරකම 05

ඔබ දුටු ශ්‍රමදානයක් ගැන පන්තියේ සාකච්ඡා කර වාක්‍ය 10ක් ලියන්න.

நீங்கள் பார்த்த சிரமதானம் பற்றி வகுப்பறையில் கலந்துரையாடி பத்து வாக்கியங்கள் எழுதுங்கள்.

# 8

# අම්බුළුවාවේ සිරිය පෙනෙයි



අන්න බලන්න, ඈතින් කන්ද පේනවා.

නදීරා දුව, අපි සිංහපිටියෙන් බහිමු.

එන්න, එන්න. මෙතනින් බහින්න.

තාත්තේ, අපි මෙතන ඉඳලා **යන්නේ කොහොම** ද?

ත්‍රීවීලර් එකකින් යමු.

අන්න අතන ත්‍රීවීලර් තියෙනවා. අපි යමු එතැනට

**අපට මේකේ ගමනක් යන්න පුළුවන්** ද?

පුළුවන්, ඔයාලා යන්නේ කොහේ ද?

අපට අම්බුළුවාවට යන්න ඕනෑ.

**කී දෙනෙක් යන්න ඉන්නවා** ද?

අපි හය දෙනෙක් ඉන්නවා.

**මේකේ තුන්දෙනෙකුට යන්න පුළුවන්.**

අපි ත්‍රීවීලර් දෙකකින් යමු.

කීයක් ගන්නවා ද?

**මීටරයේ** වැටෙන **ගාන දෙන්න.**

හරි! අපි එහෙනම් යමු.

* * *

ඔයාලා මෙතනින් බහින්න.

ඇයි? කන්ද උඩට යන්න බැරි ද?

මෙතනින් එහාට යන්න බෑ.

පයින් තමා යන්න වෙන්නේ

එහෙනම් අපි බහිමු.

මෙන්න, සල්ලි ගන්න.

කරීමා, ප්‍රගති, ශිරෝමි එන්න අපි බහිමු.

නදීරා, අර බලන්න ගේට්ටුවක්

එතන දැන්වීමක් තියෙනවා.



අවශ්‍ය **තොරතුරු විමසා දැන ගනිමු.**

කොහේ ද විමසීම් අංශය?

ආ .... අර තියෙන්නේ

එන්න දුවේ කන්ද නගිමු.

අම් .. බුළු .. වා .. ව

ඔව් ප්‍රගති, අම්බුළුවාව.

අම්මේ, මට බඩගිනියි.

අක්කාගේ බෑග් එකේ හැලප ඇති

යාළුවොත් එක්ක කන්න.

හැලප හරි ම රසයි නැන්දේ.

හා .... හා .... කරීමා නංගී

කොළේ බිම දාන්න එපා.

අර .... අතන

**කසළ බඳුන්වලට දමමු.**

**පොලිතීන් රැගෙන ඒමෙන් වළකිමු.**

මේ කන්ද මුදුනට ගම්පල නගරය ලස්සනට පේනවා.

ශිරෝමි අර බලන්න ඈත කෝච්චියක් යනවා.

ඇයි? ඊට එහා පැත්තේ ලස්සන දිය ඇල්ලකුත් පේනවා.

ප්‍රගති මෙතන පන්සලක්, පල්ලියක්, කෝවිලක් තියෙන්නේ ඇයි?

නදීරා, මේක කාටත් පොදු ස්ථානයක් නිසා වෙන්න ඇති.

මේක නම් අමුතු ම ස්ථානයක්. වී බිස්සක හැඩයට හදලා තියෙන්නේ.

මේක උඩට නගින්න පුළුවන් ද?

පුළුවන්, පුළුවන්.

අනේ අපිත් නගිමුකෝ. පුතාලා පරිස්සමින් නගින්න.

කෑ කෝ ගහන්න එපා.

අර බලන්න .... **පූජා භූමියේ විනීත ව හැසිරෙමු.**

ෂා .... මේකේ උඩට නැග්ගා ම කඳු ගොඩාක් පේනවා.

අර ඈත පේන කන්ද මොකක් ද තාත්තේ?

පුතා ඒ නමුනුකුල කන්ද. ඊට එහා තියෙන්නේ නකල්ස් කඳු වැටිය.

එතකොට අරක?

ඒ හුන්නස්ගිරි කන්ද. හරිම ලස්සන තැනක්.

ශිරෝමි අර ඈත පේන්නේ ජලාශයක් නේද?

ඔව් ඔව්. ඒ ජලාශයක් තමා.

පුතා ඒකට කියන්නේ නිල්ලඹ ජලාශය කියලා.

ප්‍රගති පුතා මෙහාට එන්න.

අර .... ගොඩාක් ඈතින් කුලුනක් පේනවා නේද?

ඔව් ඔව් තාත්තේ, මම දැක්කා.

පුතා ඒ පේන්නේ කොත්මලේ විදුලි බලාගාරය.

මෙතන නම් අපූරු සුන්දර තැනක්.

අපි අපේ යාළුවන්ටත් එන්න කියමු.

| | |
|---|---|
| මනහර කඳු පෙළ | දිස් වෙයි |
| සිසිල් සුළං ගත | දැවටෙයි |
| තුරුවැල් හැම සිසිල | ගෙනෙයි |
| අම්බුළුවාවේ සිරිය | පෙනෙයි |

# වචන මාලාව

| | | |
|---|---|---|
| යන්නේ කොහේ ද? | - | எங்கே போகிறீர்கள்? |
| කොහොම ද? | - | எப்படி? |
| කන්ද උඩට | - | மலை மேல் |
| අපට ගමනක් යන්න පුළුවන් ද? | - | எங்களுக்கு ஒரு பயணம் போக முடியுமா? |
| ත්‍රීවීලර් එක | - | முச்சக்கர வண்டி |
| පුළුවන් | - | முடியும் |
| කීයක් ගන්නවා ද? | - | எவ்வளவு எடுப்பீர்கள்? |
| මීටරයේ වැටෙන ගාන දෙන්න | - | மீற்றர் காட்டும் பணத்தைத் தாருங்கள் |
| එහෙනම් අපි යමු | - | அப்படியானால் நாம் போவோம் |
| කීදෙනෙක් යන්න ඉන්නවා ද? | - | எத்தனை பேர் போக இருக்கிறீர்கள்? |
| තුන්දෙනෙකුට යන්න පුළුවන් | - | மூவருக்குப் போக முடியும் |
| දැන්වීමක් | - | அறிவித்தல் |
| හැලප | - | இலையப்பம் |
| පන්සල | - | விகாரை |
| පල්ලිය | - | பள்ளி |

| | | |
|---|---|---|
| කෝවිල | - | கோவில் |
| කෝච්චිය | - | புகையிரதம் |
| වී බිස්ස | - | நெற்க் களஞ்சியம் |
| පූජා භූමිය | - | புனித பூமி |
| විනීත | - | ஒழுக்கம் |
| ජලාශය | - | தடாகம் |
| විදුලි බලාගාරය | - | மின் உறபத்தி நிலையம் |
| අපූර්‍ව | - | புதுமையான |

## ක්‍රියාකාරකම 01

**පිළිතුරු කියමු. ලියමු.**

*விடையைக் கூறுவோம். எழுதுவோம்.*

1. ත්‍රිරෝද රථයට නැග්ගේ කුමන ස්ථානයෙන් ද? ....................................
2. අම්මා කෑමට ගෙනාවේ මොනවා ද? ......................................................
3. කඳු මුදුනේ තිබූ ආගමික සිද්ධස්ථාන මොනවා ද? ................................
4. අම්බුළුවාවට පෙනෙන ලස්සන නගරය කුමක් ද? .................................
5. පාඩමේ ඇතුළත් උපදෙස් තුනක් ලියන්න. ..............................................

## ක්‍රියාකාරකම 02

**පිළිතුරු ලියමු.**

*விடை எழுதுவோம்.*

1. කොහෙන් ද බහින්නේ ? ......................................................
   (සිංහපිටියෙන් / අම්බුළුවාවෙන්)
2. එතන ඉඳලා යන්නේ  කොහොම ද? ......................................................
   (කෝච්චියෙන්/ත්‍රීවීලර් එකෙන්)
3. කන්ද උඩට ත්‍රීවීලර් එකෙන් යන්න බැරි ද? ............................................
   (පුළුවන්/බෑ)
4. කොහෙන් ද තොරතුරු දැනගත්තේ? ....................................................
   (විමසීම් අංශයෙන්/පන්සලෙන්)
5. මෙම පොදු ස්ථානය කුමන හැඩයකින් නිර්මාණය කර තිබේ ද?
   ................................................
   (කුලුනක හැඩයකින්/වී බිස්සක හැඩයකින්)

## ක්‍රියාකාරකම 03

**දෙබස ගොඩනගමු. කියමු. ලියමු.**

**உரையாடலை உருவாக்குவோம். கூறுவோம். எழுதுவோம்.**

ප්‍රගති : නදීකා, මාත් එක්ක ගමනක් යන්න පුළුවන් ද?

නදීකා: .......................................................................

ප්‍රගති : කන්ද උඩ පන්සලට.

නදීකා: .......................................................................

ප්‍රගති : අපි මීටර් ටැක්සියක යමු.

නදීකා: .......................................................................

ප්‍රගති : මීටරේ වැටෙන ගාන දෙමු.

නදීකා: .......................................................................

ප්‍රගති : කන්ද උඩට ම යන්න බෑ.

නදීකා: .......................................................................

ප්‍රගති : ඉතිරි ටික පයින් යමු.

(කන්ද උඩට ම යන්න පුළුවන් ද?/ඉතිරි ටික යන්නේ කොහොම ද?/කොහොමද යන්නේ?/කීයක් ගනී ද?/පුළුවන් ප්‍රගති, කොහේ ද යන්නේ?)

## ක්‍රියාකාරකම 04

**පාඩම කියවා වාක්‍ය සම්පූර්ණ කරමු. ලියමු.**

*பாடத்தை வாசித்து வாக்கியத்தைப் பூரணப்படுத்துவோம். எழுதுவோம்.*

1. ශිරෝමි අර බලන්න ඇත ........................................ යනවා.
2. එහා පැත්තේ ලස්සන ............................................... පේනවා.
3. මේකේ උඩට නැග්ගා ම ............................................... පේනවා.
4. පුතා ඒ .................................... කන්ද.
5. ඊට එහා තියෙන්නේ ................................................. කන්ද.
6. පුතා ඒකට කියන්නේ .................................................. ජලාශය කියලා.
7. පුතා ඒ පේන්නේ ...................................... විදුලි බලාගාරය.

## ක්‍රියාකාරකම 05

**ඔබේ පාසල් භූමියේ දක්නට ලැබෙන උපදෙස් වැකි ලියන්න.**

*உங்கள் பாடசாலை வளவில் காணக்கூடிய அறிவுறுத்தல்களை எழுதுங்கள்.*

1. ..........................................................................................................
2. ..........................................................................................................
3. ..........................................................................................................
4. ..........................................................................................................
5. ..........................................................................................................

9

# අපි කොළඹ යමු

පුතා, මොකද මේ කලබලේ දුවගෙන එන්නේ?

තාත්තේ, තාත්තේ මේ ලියුම විදුහල්පතිතුමා දුන්නා.

පුතා ම ලියුම කියවන්නකෝ බලන්න.



මගේ අංකය / /
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය.
2021.08.09

විදුහල්පති,
වව්/දෙමළ මහා විද්‍යාලය,
වව්නියාව.

**<u>දෙවන ජාතික භාෂාව (සිංහල) ඇගයීම් ක්‍රියාවලිය</u>**

**<u>සමස්ත ලංකා මට්ටම 2021</u>**

දෙවන බස සිංහල සමස්ත ලංකා **කථික තරගය** 2021.09.30 වන දින **පෙ.ව.** 9.00 සිට ප.ව. 4.00 දක්වා පැවැත්වේ.

ඉහත තරගය සඳහා ඔබ විදුහලේ 9 ශ්‍රේණියේ ඒ.කේ. ෂම්මුගනාදන් ශිෂ්‍යයා සුදුසුකම් ලබා ඇති බව සතුටින් දන්වා සිටිමු. කරුණාකර එම ශිෂ්‍යයා භාරකරුවකු සමග තරගය සඳහා සහභාගි කරවන්න.

**ස්ථානය** - දෙමළ මහා විද්‍යාලය, කොළඹ 10
**ශාලා අංකය** - 03
**වේලාව** - පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා

එදින නියමිත වේලාවට පෙර අදාළ ස්ථානයට පැමිණෙන්න. වැඩි විස්තර සඳහා 011-2223250 යන අංකය අමතන්න.

අධ්‍යක්ෂ
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

කොහොමද පුතේ අපි කොළඹ යන්නේ?

අපි කෝච්චියෙන් යමු තාත්තේ.

ඔව්, ඒක හොඳයි. අපි කෝච්චියෙන් යමු.

ටිකට් කලින් **වෙන් කරවා ගන්න** වෙයි නේද තාත්තේ?

ඔව්, හවස දුම්රියපොළට යමු ටිකට් ගන්න.

තාත්තේ, ස්ටේෂන් එකට තව ගොඩක් දුර ද?

අන්න, පුතේ අතන දුම්රියපොළ. එන්න මේ පැත්තෙන් යමු.

ප්‍රවේශ පත්‍ර ගන්නේ කොහෙන් ද?

තාත්තේ, අර මාමාගෙන් අහලා බලමු.

මහත්මයා **ප්‍රවේශ පත්‍ර කවුළුව** කොතන ද?

ටිකට් දෙන්නේ අතන. එතනින් ගන්න පුළුවන්.

මහත්මයා අපට 30 වෙනිදාට කොළඹ යන්න

**ප්‍රවේශ පත්‍ර** දෙකක් ගන්න ඕන.

**කීයට විතර ද** යන්න බලාපොරොත්තු වෙන්නේ?

උදේ 8.00 වෙද්දි කොළඹට යන්න ඕන.

පාන්දර 2.00ට එකක් තියෙනවා. ඒක **මන්දගාමී.**

උදේ 8.00ට නම් යන්න බෑ.

පාන්දර 2.15 **ශීඝ්‍රගාමී දුම්රිය** තියෙනවා. ඒකෙන් යන්න.

ඒකේ **පහසුකම්** කොහොම ද?

පළමුවැනි පන්තියේ නිදන මැදිරි පහසුකම් තියෙනවා.

වායුසමනය කළ මැදිරිත් තියෙනවා.

අපට දෙවැනි පන්තියේ ටිකට් දෙකක් දෙන්න.

**ගාස්තුව කීයක්** වෙනවා ද?

එක්කෙනෙකුට දාහයි. දෙදාහක් දෙන්න.

ආ ... මෙන්න සල්ලි.

බොහොම ස්තුතියි මහත්මයා.

# වචන මාලාව

| | | |
|---|---|---|
| දුම්රිය | - | புகையிரதம் |
| ශීඝ්‍රගාමී | - | கடுகதி |
| මන්දගාමී | - | சாதாரண |
| නිදන මැදිරි | - | உறங்கும் அறை |
| පහසුකම් | - | வசதிகள் |
| වායුසමනය කළ | - | குளிரூட்டப்பட்ட |
| ප්‍රවේශ පත්‍ර | - | அனுமதிப்பத்திரம் |
| කවුළුව | - | கருமபீடம் |
| දුම්රිය ස්ථානය | - | புகையிரத நிலையம் |
| අහන්න | - | கேளுங்கள் |
| වෙන් කරවා ගන්න | - | ஒதுக்கிக் கொள்ளுங்கள் |
| ගාස්තුව | - | காசுக் கட்டணம் |
| එතනින් | - | அவ்விடத்தில் / அந்த இடத்தில் |
| මෙතනින් | - | இவ்விடத்தில் / இந்த இடத்தில் |
| විමසීම් | - | விசாரணை |
| කීයට විතර ද? | - | எத்தனை மணியளவில் |

| | | |
|---|---|---|
| කැඳවීම් ලිපියක් | - | அழைப்புக் கடிதம் |
| සමස්ත ලංකා | - | அகில இலங்கை |
| කථික තරගය | - | பேச்சுப் போட்டி |
| සහභාගි වීම | - | கலந்து கொள்ளுதல் |
| කැඳවීම | - | அழைத்தல் |
| සතුටින් | - | மகிழ்ச்சியோடு |
| තෝරා ගෙන | - | தெரிவுசெய்து |
| පෙරවරු | - | முற்பகல் |
| කනිෂ්ඨ අංශය | - | கனிஷ்ட பிரிவு |
| පාන්දර | - | அதிகாலை |

## ක්‍රියාකාරකම 01

වාක්‍ය සම්පූර්ණ කරමු. ලියමු.
வாக்கியத்தைப் பூரணப்படுத்துவோம். எழுதுவோம்.

උදා:- මම දුම්රියෙන් කොළඹ යමි.
අපි දුම්රියෙන් කොළඹ යමු.

| | | |
|---|---|---|
| මම<br>අපි | බස් එකෙන්<br>කාර් එකෙන්<br>බයිසිකලෙන්<br>පයින්<br>වෑන් එකෙන් | යමි<br>යමු |

## ක්‍රියාකාරකම 02

ලියමු. කියමු.
எழுதுவோம். கூறுவோம்.

1. පෙ.ව. - පෙරවරු
2. ප.ව. -
3. ස.තො.ස.
4. දෙ.ම.වි.
5. රා.සේ.පි.
6. ස.ණ.ස
7. ලං.ග.ම.
8. ලං.වි.ම.
9. ලං.දු.දෙ.

## ක්‍රියාකාරකම 03

**පාඩම කියවා හිස්තැන් පුරවන්න.**

*பாடத்தை வாசித்து இடைவெளி நிரப்புவோம்.*

1. ටිකට් වෙන් කරවා ..................................
2. ප්‍රවේශ පත්‍ර ............................ කොතනින් ද ?
3. එක්කෙනෙකුට රුපියල් දාහක් ........................
4. අද ම ටිකට් .................................... පුළුවන්.
5. අපි ......................... දෙවැනි පන්තියේ ටිකට්

ගත්තේ
ගන්න
ගන්නේ
ගන්නවා
ගන්නත්

## ක්‍රියාකාරකම 04

**පිළිතුරු ලියමු.**

*விடை எழுதுவோம்.*

1. ෂම්මුගනාදන් සහභාගි වන්නේ කුමන තරගය සඳහා ද? ...............................
2. තරගය පවත්වන්නේ කවදා ද? .......................................................................
3. තරගය තියෙන්නේ කොහේ ද?.......................................................................
4. ප්‍රවේශ පත්‍ර ගත්තේ කොහෙන් ද? ..............................................................
5. ශීඝ්‍රගාමී දුම්රිය තියෙන්නේ කීයට ද? ...................................................
6. ඔවුන් ගත්තේ කීවැනි පන්තියේ ටිකට් ද? .............................................

## ක්‍රියාකාරකම 05

**ගැළපෙන වචන යොදා ලිපිය සම්පූර්ණ කරමු.**

பொருத்தமான சொற்களை வைத்து கடிதத்தைப் பூரணப்படுத்துவோம்.

1. 2021.08.30
2. (දෙමළ)
3. කුෂානී නවරත්න
4. අධ්‍යාපන අමාත්‍යාංශය,
5. සමස්ත ලංකා
6. කියවීම

මගේ අංකය :-
.........................
ඉසුරුපාය,
බත්තරමුල්ල.
2021.08.09

විදුහල්පති,
කඳුරුවෙල මහා විද්‍යාලය,
පොළොන්නරුව.

**මහත්මයාණනි/මහත්මියනි,**

**<u>දෙවන ජාතික භාෂාව ........................... ඇගයීම් ක්‍රියාවලිය</u>**

**<u>..................... මට්ටම 2021</u>**

ඔබ විද්‍යාලයේ .............................. ශිෂ්‍යයා/ශිෂ්‍යාව දෙවන භාෂාව (දෙමළ) 9 වන ශ්‍රේණිය ......................... තරගය සඳහා තෝරා ගෙන ඇති බව සතුටින් දන්වා සිටිමි.

ඉහත තරගය සඳහා ඔහු/ඇය එදිනට සහභාගි කරවන්න.

| | |
|---|---|
| ස්ථානය | - කාන්තා විද්‍යාලය, කොළඹ 07. |
| දිනය | - ............................................ |
| වේලාව | - පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා |

අධ්‍යක්ෂ
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

# 10

# තල් ගම්මානය

ආ ... රාජු එන්න එන්න.

කෝ අපේ අනෙක් යාළුවෝ?

ආ ... අර ඉන්නේ.

අන්වර්, රමේෂ්,

ක්‍රිස්ටි එන්න එන්න.

මෙතන ඉඳලා

තල් ගම්මානයට

කොහොම ද යන්නේ

කියලා අහලා බලමු.

ඒක හොඳයි.

අන්න අර

මාමාගෙන් අහමු.



මාමේ, මාමේ අපට උදව්වක් කරන්න පුළුවන් ද?

මොකක් ද පුතාලා?

මාමේ, තල් ගම්මානයට යන්නේ කොහොම ද?

ආ ... තල් ගම්මානෙට ද?

පුතාලාට අර ඈත තියෙන කෝවිල පේනවා නේ ද?

ඔව් මාමේ, අර වම් පැත්තේ තියෙන පුංචි කෝවිල ද?

අන්න හරි පුතේ.

ඒ කෝවිල ළඟින් වමට හැරිලා **ඉස්සරහට** යන්න.

මාමේ **මෙහේ** ඉඳලා **කොච්චර දුර** යන්න ඕන ද?

**මීටර් සීයක්** විතර ඉස්සරහට යන්න.

යනකොට හතරමං **හන්දියක් තියෙනවා.**

එතැනින් දකුණට හැරෙන්න. ඒක බොරලු පාරක්.

ඒ පාර දිගේ යනකොට විශාල **දැන්වීම් පුවරුවක් තියෙනවා.**

**තල් ගම්මානය** කියලා. එකේ දකුණට ඊතලයක් ඇති.

**දැන්වීම් පුවරුව** පහු කරගෙන දකුණු පැත්තට යන්න.

පාර දෙපැත්තෙ ම උස තල් ගස් තියෙනවා.

මාමේ, **එහේ මොනවා** ද බලන්න **තියෙන්නේ?**

තල් අතුවලින් සෙවිලි කළ ගෙවල් තියෙනවා.

තල් වැටවල් තියෙනවා.

තල් වැටවල් ...?

ඔව් පුතා, තල් අතු වේළලා ඒවා කපලා වැටවල් හදනවා.

තල්වලින් වෙන මොනවා ද **නිෂ්පාදනය කරන්නේ?**

ඒ ගමේ මිනිස්සු **තල් ආශ්‍රිත** භාණ්ඩ හදනවා.

කොසු, බුරුසු, මල් පෝච්චි, පැදුරු, වට්ටි, පෙට්ටි වගේ දේවල්.

අපට ඒ භාණ්ඩ ගන්න පුළුවන් ද?

ඔව් පුළුවන්, මේ පැත්තේ වගේ එහෙත් කඩවල් තියෙනවා.

එහේ වෙන මොනවාද තියෙන්නේ මාමේ?

කොට්ට කිළංගු, පනාටු, තල් පැණි, තල් හකුරු වගේ

කෑම බීමත් තියෙනවා. හරි ම රසයි.

තල් ගසුත් පොල් ගස් වගේ ම ප්‍රයෝජනවත් නේ ද?

ඔව්, ඔව් පුතාලා ගිහිල්ල ම බලන්නකෝ.

හොඳයි මාමේ,

බොහෝ ම ස්තුතියි.

අපි ගිහිං එන්නම්.

පුතාලට සුබ ගමන්!

පෙළින් පෙළට අර තියෙන්නෙ ගෙඩිමල් පිරි ගස්
උස ම උසයි ගොඩක් උසයි මෙහි ඇති තල් ගස්
වට්ටි පෙට්ටි පැදුරු වියයි යටට වෙලා ගස්
හකුරු එක්ක කන්න රසයි මේ අල තල් ගස්

(මුණසිංහ එම්. ගමගේ)



# වචන මාලාව

| | | |
|---|---|---|
| මෙතන ඉඳලා | - | இங்கிருந்து |
| තල් ගම්මානය | - | பனைமர ஊர் |
| කොහොම ද යන්නේ ? | - | எப்படி போவது? |
| ඉස්සරහට | - | முன்னால் |
| කොච්චර දුර ද? | - | எவ்வளவு தூரம்? |
| භාණ්ඩ ගන්න පුළුවන් ද? | - | பொருட்கள் வாங்க முடியுமா? |
| හන්දියක් තියෙනවා | - | சந்தி இருக்கிறது |
| දැන්වීම් පුවරුවක් තියෙනවා | - | அறிவித்தல் பலகை இருக்கிறது |
| හකුරු | - | கருப்பட்டி |
| මොනවා ද තියෙන්නේ? | - | என்ன இருக்கிறது |
| ඒ පැත්තේ | - | அந்தப் பக்கம் |
| නිෂ්පාදනය කරන්නේ | - | தயாரித்தல் |
| මේ පැත්තත් | - | இந்தப் பக்கம் |
| එහේ | - | அங்கே |
| මෙහේ | - | இங்கே |
| තල් ආශ්‍රිත භාණ්ඩ | - | பனைஉற்பத்திப் பொருட்கள் |
| දකුණට ඊතලයක් ඇති | - | இடது பக்கம் அம்புக்குறி இருக்கும் |
| ප්‍රයෝජනවත් | - | பிரயோசனமானது |
| ගිහිල්ල ම බලන්න | - | போய்ப் பாருங்கள் |
| සුබ ගමන් | - | இனிய பயணம் |

## ක්‍රියාකාරකම 01

**පිළිතුරු ලියමු. කියවමු.**

விடை எழுதுவோம். கூறுவோம்.

01. ළමයි නැරඹීමට ගියේ කුමක් ද? ..........................................................

02. කෝවිල ළඟින් හැරී යන්න කීවේ මොන පැත්තට ද?.........................

03. එම ගම්මානයේ නිෂ්පාදනය කරන විසිතුරු භාණ්ඩ පහක් ලියන්න.

..........................................................................................................

04. නැරඹීමට ගිය ස්ථානයේ ඇති ආහාර වර්ග මොනවා ද? ..........................

05. ගම්මානයේ පාර දෙපස පේළියට ඇත්තේ මොනවා ද?...........................

## ක්‍රියාකාරකම 02

**ගළපමු. කියමු. ලියමු.**

பொருத்தமான சொற்களை வைத்து இடைவெளி நிரப்புவோம். கூறுவோம். எழுதுவோம்.

1. බොරලු පාර ......................... යන්න.
2. දැන්වීම් පුවරුව ......................... යන්න.
3. කෝවිල ළඟින් වමට හැරිලා .................. යන්න.
4. එතැනින් ........................... හැරෙන්න.
5. යන කොට ......................... තියෙනවා.

(පහු කර ගෙන, ඉස්සරහට, දිගේ, දකුණට, හතරමං හන්දියක්)

## ක්‍රියාකාරකම 03

වචන ගළපා වාක්‍ය කියමු. ලියමු.

சொற்களை இணைத்து வாக்கியம் கூறுவோம். எழுதுவோம்.

| | | |
|---|---|---|
| එහෙ<br>මෙහෙ | කොට්ට කිළංගු<br>පනාටු<br>තල් පැණි<br>තල් හකුරු<br>තල් ජෑම් | හදනවා |

1. ..........................................................................................................

2. ..........................................................................................................

3. ..........................................................................................................

4. ..........................................................................................................

5. ..........................................................................................................

## ක්‍රියාකාරකම 04

වාක්‍ය ගළපමු. කියමු. ලියමු.

தொடர்புபடுத்தி வாக்கியமாக்குவோம். கூறுவோம். எழுதுவோம்.

උදාහරණ 1. වතුර බොන්න පුළුවන් ද?

2. වතුර බොන්න පුළුවන්.

| | | |
|---|---|---|
| උදවු<br>පාර<br>වතුර<br>කෑම<br>පයින් | කරන්න<br>කන්න<br>කියන්න<br>යන්න<br>බොන්න | පුළුවන් ද?<br>පුළුවන් |

1. ..............................................................
2. ..............................................................
3. ..............................................................
4. ..............................................................
5. ..............................................................

## ක්‍රියාකාරකම 05

ඔබ නැරඹීමට ගිය ස්ථානයක ගමන් මාර්ගය පිළිබඳව සාකච්ඡා කරන්න. පන්තියට ඉදිරිපත් කරන්න.

*நீங்கள் பார்வையிடச் சென்ற இடத்திற்குச் செல்லும் பாதை தொடர்பாகக் கலந்துரையாடுவோம். அதனை வகுப்பறையில் முன்வைப்போம்.*

# 11

# කෑම කමු

**(අභයපුර සුහද ක්‍රීඩා සමාජයේ, සාමාජිකයෝ ඇඹිලිපිටියේ පැවති වොලිබෝල් තරගයකට සහභාගි වුණා. තරගයෙන් පසු සියලු දෙනා ම ආපසු එන්න පිටත් වුණා.)**

අනුර, දැන් නම් හොඳට ම බඩගිනියි. කෑම කාලා ම යමු.

ඔව් ගනේෂ්, හොඳට ම දවල් වෙලා.

උමර් අයියේ, කෑම කඩයක් ළඟ වාහනය නවත්වන්න.

''මල්ලී, ඉස්සරහ කඩ පේළියක් තියෙනවා

එහේ බලමු.''

**හොඳයි අයියේ,**

මම වාහනේ මෙතන නවත්තන්නම්.

ඔයාලා කෑම ගන්න තැනක් බලන්න.

මාමේ, මේ හරියේ හොඳ කෑම කඩයක් තියෙනවා ද?

තියෙනවා. පොඩ්ඩක් ඉස්සරහට ගිහින් හන්දියෙන් වමට හැරෙන්න.

එතැන හෝටලයක් තියෙනවා.

බොහොම ස්තුතියි, මාමේ.

ඉක්මනට යමු.

ගනේෂ්, අර තියෙන්නේ ''මිහිරි හෝටලය''

අපි ඇතුළට යමු.

එන්න ළමයි. එන්න ඇතුළට.

දවල් කෑමට මොනවා ද තියෙන්නේ මුදලාලි?



එළවළු, මාළු, බිත්තර ඕන දෙයක් තියෙනවා.

මෙහේ කෑම පිරිසිදුයි, රසයි ගමේ කෑම

ළමයි වාඩිවෙන්න. මොනවා ද කන්නේ?

රවිඳු, මට බිත්තර හොඳයි.

මටත් බිත්තර.

නිමල් ඔයාට ?

මට මාළු කෑම.

උමර් අයියා මොනවා ද කන්නේ?

මට එළවළු හොඳයි මල්ලී.

තව කී දෙනෙක් ඉන්නවා ද?

තව එක්කෙනයි.

ජගත් ඔයාට?

මටත් එළවළු කෑම එකක්

ආ ... හරි එහෙනං ...

එක්කෙනෙක් මාළු කෑම,

දෙන්නෙක් බිත්තර,

තව දෙන්නෙකුට එළවළු,

ඔක්කොම කෑම පහයි.

හොඳයි ගේන්නම්.

අපි අතනින් අත් සෝදමු.

# වචන මාලාව

| | | |
|---|---|---|
| දවල් කෑම | - | மதிய உணவு |
| එළවළු | - | மரக்கறி |
| මාළු | - | மீன் |
| බිත්තර | - | முட்டை |
| කෑම විතරයි | - | சாப்பாடு மட்டும் |
| දැන්නම් | - | இப்பொழுது |
| හොඳයි | - | நல்லது |
| පිරිසිදුයි | - | சுத்தமானது |
| කී දෙනෙක් ඉන්නවා ද? | - | எத்தனை பேர் இருக்கிறார்கள்? |
| දෙන්නෙක් | - | இருவர் |
| එක්කෙනෙක් | - | ஒருவர் |
| එහේ | - | அங்கே |
| මෙහේ | - | இங்கே |
| අයියේ | - | அண்ணா |
| රසයි | - | ருசி/ சுவை |

## ක්‍රියාකාරකම 01

**ප්‍රශ්නවලට පිළිතුරු ලියමු.**

**வினாக்களுக்கு விடை எழுதுவோம்.**

1. වොලිබෝල් තරගය පැවැත්වුණේ කොහේ ද? ....................................
2. හෝටලයට යන විට හන්දියෙන් හැරුණේ මොන පැත්තට ද? ...............
3. ''මෙහේ කෑම පිරිසිදුයි. රසයි.'' මෙසේ කීවේ කවුද? ...........................
4. ජගත් කෑවේ මොනවා ද? ......................................................................
5. හෝටලයෙන් කෑම කීයක් ගත්තා ද? ....................................................

## ක්‍රියාකාරකම 02

**i. හිස්තැනට සුදුසු වචන යොදමු. කියමු.**

இடைவெளிக்குப் பொருத்தமான சொல்லை எழுதுவோம். கூறுவோம்.

**(පස්දෙනෙක්/එක්කෙනයි/දෙන්නෙක්/පහයි/දෙන්නෙකුට)**

1. ................................ එළවළු කෑම ගත්තා.
2. තව ................................ ගත්තේ බිත්තර කෑම.
3. මාළු කෑම ගත්තේ ......................................
4. කෑම කන්න හෝටලයට ..................................... ගියා.
5. ඔක්කොම කෑම ..........................................

**ii.** අකුරෙන් ලියමු. කියමු.

எழுத்தில் எழுதுவோம். கூறுவோம்.

ළමයි කණ්ඩායමක් ආපන ශාලාවකට ගොස් කෑම ගත්තෝ ය. ඔවුන් කෑම සඳහා වියදම් කළේ මෙසේ ය.

| ප්‍රමාණය | වර්ගය | මුදල රුපියල් | මුදල අකුරෙන් ලියන්න |
|---|---|---|---|
| 5 | එළවළු කෑම | 500 | ..................................... |
| 1 | බිත්තර කෑම | 120 | ..................................... |
| 2 | මාළු කෑම | 260 | ..................................... |
| එකතුව | | 880 | ..................................... |

## ක්‍රියාකාරකම 03

විරුද්ධ අර්ථය දෙන පද පාඩමෙන් සොයමු. ලියමු. කියවමු.
எதிர்க்கருத்து சொல்லைப் பாடத்தில் தேடுவோம். எழுதுவோம். கூறுவோம்.

**උදාහරණ :- හොඳ - නරක**

1. අපිරිසිදු ..................................
2. දකුණට ..................................
3. මෙතැන ..................................
4. රාත්‍රි/රෑ ..................................
5. එළියට ..................................
6. නැගිටින්න ..................................
7. දෙන්න ..................................
8. යන්න ..................................
9. හෙමිහිට ..................................
10. පස්සට ..................................

## ක්‍රියාකාරකම 04

**වචන ගළපා වාක්‍ය සාදා කියමු. ලියමු.**

சொற்களை ஒழுங்குபடுத்திக் கூறுவோம். எழுதுவோம்.

1. ළඟ/කඩයක්/නවත්තමු/කෑම/වාහනය ..............................................
2. හොඳ/තියෙනවා ද?/මේ හරියේ/කඩයක්/කෑම ..................................
3. හන්දියෙන්/දකුණට/හැරෙන්න/ඉස්සරහ ..............................................
4. දෙන්න/හතක්/කෑම/අපිට/එළවළු...............................................................
5. ඉන්න/කෑම/වාඩිවෙලා/මම/ළමයි/ගේන්නම් ........................................

## ක්‍රියාකාරකම 05

**වාක්‍ය අනුපිළිවෙළට සකස් කරමු.**

வாக்கியங்களை ஒழுங்குபடுத்துவோம்.

- ආපණ ශාලාවක් ළඟ වාහනය නතර කළා.
- කෑම කාලා ආපහු ගමන පිටත් වුණා.
- ඒ අය ගියේ පියල් මාමාගේ වෑන් රථයෙන්.
- නාට්‍ය බලලා එන අතරතුර ඔක්කොට ම හොඳට ම බඩගිනි වුණා.
- යාළුවෝ කණ්ඩායමක් නාට්‍යයක් බලන්න ගියා.
- ඒ ආපණ ශාලාව පිරිසිදු එකක්.

1. ..........................................
2. ..........................................
3. ..........................................
4. ..........................................
5. ..........................................
6. ..........................................

# 12

# යාළුවාගේ ගෙදර යන දවස



රුවන් විජේසිංහ,
මීවනපලාන,
හොරණ.
2021.11.01

දෙවි පිහිටයි!

ආදරණීය රමේෂ්,

ඔයාගේ සැප සනීප කොහොම ද? අපි නම් සනීපෙන් සිටිනවා. අපේ පාසලේ බාලදක්ෂ කඳවුරක් පැවැත්වූවා. මමත් සහභාගි වුණා. මේ දිනවල අතපසු වුණ පාඩම් වැඩ කරනවා. හුඟ කාලයකින් ඔයාට ලියන්න බැරි වුණා. ඉතින් මොනවා ද ඔයාගෙ අලුත් තොරතුරු? ඔයා වාර විභාගයට ලෑස්ති වෙනවා ද? මමත් පාඩම් කරනවා.

රමේෂ්, ඔයා හැමදා ම නිවාඩු කාලේ ඔයාලගේ ගෙදර එන්න කියනවනේ. ඔන්න අපි මේ නිවාඩුවට එනවා. රමේෂ් ඔයා ගෙදර ඉන්නවා නේද? ඔයාලගේ ගෙදර ළඟ **කුරුලු උයනක්** තියෙනවා නේද? අපට **කුරුලු උයනත් බලන්න** යන්න ඕන. දිය ඇලි බලන්නත් ආසයි. වෙන මොනවාද අපට බලන්න තියෙන්නේ? ඔයා තාත්තාගෙන් අහලා බලන්න. ඉතින් රමේෂ් හුඟාක් ලිව්වා. හමු වී විස්තර කතා කරමු. ඔබට දෙවි පිහිට ලැබේවා!

මෙයට,
ආදරණීය මිතුරා
රුවන්

# වචන මාලාව

| | | |
|---|---|---|
| ඔයා | - | நீங்கள் |
| ඔයාලාගේ | - | உங்களுடைய |
| හුග කාලයකින් | - | நீண்ட காலமாக |
| නිවාඩු කාලේ | - | விடுமுறை காலத்தில் |
| අලුත් තොරතුරු | - | புதிய தகவல்கள் |
| කුරුලු උයන | - | பறவைப் பூங்கா |
| බලන්න | - | பார்க்க |
| දිය ඇලි | - | நீர் வீழ்ச்சி |
| බලාපොරොත්තු | - | எதிர்பார்ப்பு |
| ඕන | - | வேண்டும் |
| හැමදාම | - | தினந்தோறும் |
| ආසයි | - | ஆசை |

## ක්‍රියාකාරකම 01

ලබා දී ඇති තොරතුරු උදවු කරගෙන ලිපියේ හිස්තැන් පුරවමු.

கொடுக்கப்பட்டுள்ள தகவல்களைக் கொண்டு கடிதத்தின் இடைவெளிகளைப் பூரணப்படுத்துவோம்.

(චාවාකච්චේරිය/දෙවි පිහිටයි/අපි සියලු දෙනා ම සනීපෙන් ඉන්නවා/අපි නුවර යනවා/වර්ෂා රවීන්ද්‍රන්/ අපි වැව රවුමේ ඇවිදින්න යනවා/වර්ෂා/ කෝවිල පාර/ මල් වත්තටත් යනවා)

2021.07.04

ආදරණීය නෂ්රි,

ඔබගේ සැප සනීප කෙසේ ද?

මේ නිවාඩු කාලේ

ඔයත් එනවා නම් මම කැමතියි.

අම්මාගෙන් අහලා ඔයත් එන්න.

මෙයට මිතුරිය

## ක්‍රියාකාරකම 02

පින්තූරය බලා (නිර්මාණාත්මක) වාක්‍ය පහක් ලියන්න.

*படத்தை அவதானித்து ஆக்கபூர்வமான ஐந்து வாக்கியங்கள் எழுதுக.*



1. ..................................................................
2. ..................................................................
3. ..................................................................
4. ..................................................................
5. ..................................................................

## ක්‍රියාකාරකම 03

**පාඩමෙන් සොයා පිළිතුරු කියමු. ලියමු.**

*பாடத்தில் தேடி விடை கூறுவோம். எழுதுவோம்.*

1. මේ ලිපිය ලියන්නේ කාට ද? ..........................................................................
2. රුවන් සහභාගි වූ කඳවුර කුමක් ද? ...............................................................
3. මේ දිනවල රුවන් කරන්නේ කුමක් ද? .........................................................
4. රමේෂ්ලාගේ ගෙදර අවට ඇති ලස්සන තැන් මොනවා ද? ..........................
5. රුවන් රමේෂ්ලාගේ ගෙදර යන්න බලාපොරොත්තු වන්නේ මොන දවස්වල ද? ................................

## ක්‍රියාකාරකම 04

**හිස්තැනට සුදුසු වචන තෝරන්න. ලියන්න.**

**இடைவெளிக்குப் பொருத்தமான சொல்லைத் தெரிவுசெய்யுங்கள். எழுதுங்கள்.**

1. ............................... දුන්හිඳ බලන්න ගියා ද? (ඔයා/ඔයාගේ)
2. ............................... ගොඩක් ස්තුතියි. (ඔයා/ඔයාට)
3. ............................... ලිපිය මට ලැබුණා (ඔයාලා/ඔයාගේ)
4. ............................... විනෝද චාරිකාව යනවා ද? (ඔයාලා/ඔයාලාට)
5. ............................... පීනන්න පුළුවන් ද? (ඔයාලාට/ඔයාගේ)

## ක්‍රියාකාරකම 05

**කථන භාෂාවෙන් ඇති වාක්‍ය කොටස් ලිඛිත භාෂාවෙන් ලියන්න.**

*பேச்சு மொழியில் உள்ள சொற்களை எழுத்து மொழியில் எழுதுங்கள்.*

**උදාහරණ :- කරන්නෝන - <u>කරන්න ඕන</u>**

1. බලන්නෝන ................................
2. යන්නෝන ................................
3. පීනන්නෝන ................................
4. එන්නෝන ................................
5. කරන්නෙපා ................................
6. කන්නෙපා ................................
7. එන්නෙපා ................................
8. එන්නැද්ද ................................
9. කන්නැද්ද ................................
10. යන්නැද්ද ................................

## ක්‍රියාකාරකම 06

**ඔබේ හොඳ ම යාළුවාට ලිපියක් ලියන්න.**

*உங்களுடைய நெருங்கிய நண்பருக்கு கடிதம் எழுதுங்கள்.*

# 13

# ආරාධනා පත්‍රයක් හදමු

ආයුබෝවන් ගුරුතුමී!

ආයුබෝවන් දරුවනේ!

අපි ලිපි හොයාගෙන ආවා.



හරි ම හොඳයි, කසුන් පුතා, මොනවා ද ගෙනාවේ?

මම ආරාධනා පත්‍රයක් ගෙනාවා ටීචර්.

ආරාධනා පත්‍රයක් ....?

ඔව් ටීචර් පාරක් විවෘත කිරීමක්.


හරි, මහේෂ් පුතා මොනවා ද ගෙනාවේ?

මට ආරාධනා පත්‍ර දෙකක් ම ලැබුණා.

පුතා .... මොනවා ද ඒවායේ තියෙන්නේ?

උපන් දින සාදයක්. අනික පුස්තකාලයක් විවෘත කිරීමක්.

කෝ බලන්න....



**ආරාධනයයි!**

මහ/අශෝක විද්‍යාලයේ ළමා පුස්තකාලය

**2021 මාර්තු මස 25 දින**

**පෙ.ව. 10.30 ට**

මහනුවර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ

ප්‍රධානත්වයෙන් විවෘත කරනු ලැබේ.

මෙම උත්සවයට සහභාගි වන මෙන්

ඔබ වහන්සේට/ඔබතුමාට/ඔබතුමියට

ගෞරවයෙන් ආරාධනා කරමු.

සංවිධායක කමිටුව

ආරාධනා පත්‍රය හරි ම ලස්සනයි.

දිලීප මොනවා ද ගෙනාවේ?

අක්කා මට එවපු ලියුමක් ගෙනාවා.

හොඳයි තව කවුද ගෙනාවේ?

ටීචර් ප්‍රජා ශාලාවට ක්‍රීඩා භාණ්ඩ ඉල්ලපු ලිපියක් ගෙනාවා.

හොඳයි තුෂාර, වෙන කවුද ලිපි ගෙනාවේ?

ටීචර් මේක ස්තුති කිරීමේ ලිපියක්.

නාලක පුතා ම කියවන්න බලන්න.

පුබුදු ළමා සමාජය,
නුවර පාර,
දඹුල්ල.
2021.05.10

සභාපති,
ජනහිත සංවිධානය,
සමගි මාවත,
අනුරාධපුරය.

මහත්මයාණෙනි,

<u>පොත් ලබා දීම සම්බන්ධවයි.</u>

අපගේ ඉල්ලීම පරිදි ළමා සමාජයේ පුස්තකාලයට වටිනා පොත් රැසක් ජනහිත සංවිධානය මගින් පරිත්‍යාග කර ඇත. ඒ පිළිබඳව පුබුදු ළමා සමාජයේ ස්තුතිය පුද කරමු.

ස්තුතියි
මෙයට

................ ................

ලේකම් සභාපති

පුබුදු ළමා සමාජය පුබුදු ළමා සමාජය

හරි ම හොඳයි, විවිධාකාර ලිපි ගෙනල්ලා නේ ද?

ටීචර්, අපි ආරාධනා පත්‍රයක් හදමු.

ඔව්, අද අපි ආරාධනා පත්‍රයක් හදමු.

## වචන මාලාව

| | | |
|---|---|---|
| ආයුබෝවන් | - | வணக்கம் |
| ලිපි | - | கடிதங்கள் |
| ගෙනාවේ | - | கொண்டு வந்தீர்கள் |
| හොයා ගෙන ආවා | - | தேடிக் கொண்டு வந்தேன் |
| ආරාධනා පත්‍රයක් | - | அழைப்பிதழ் |
| විවෘත කිරීමක් | - | திறப்பு விழா |
| උපන්දින සාදයක් | - | பிறந்தநாள் விழா |
| පුස්තකාලය | - | நூலகம் |
| ක්‍රීඩා භාණ්ඩ | - | விளையாட்டு உபகரணங்கள் |
| විවිධාකාර ලිපි | - | பல்வகையான கடிதங்கள் |
| හදමු | - | செய்வோம் |

## ක්‍රියාකාරකම 01

**කියවමු. පිළිතුරු ලියමු.**

வாசிப்போம். விடை எழுதுவோம்.

01. ආරාධනා පත්‍ර ගෙනාවේ කවුද? ....................................................

02. පාඩමේ සඳහන් ආරාධනා පත්‍ර මොනවා ද?.........................................

03. ළමා පුස්තකාලය විවෘත කරන්නේ කවුද? ...................................

04. නාලක ගෙනත් තිබුණේ කුමක් ද? ........................................................

05. පුබුදු ළමා සමාජයට පොත් පරිත්‍යාග කළේ කවුද? ............................

## ක්‍රියාකාරකම 02

**පුස්තකාලයේ සාමාජිකත්වය ලබා ගැනීමට ඉල්ලුම් පත්‍රයක් පුරවමු.**

நூலகத்தில் அங்கத்துவம் பெற்றுக் கொள்வதற்காக விண்ணப் பப்படிவம் நிரப்புவோம்.

01. ඉල්ලුම්කරුගේ නම .......................................

02. ශ්‍රේණිය .......................................

03. පන්තිභාර ගුරුවරයාගේ නම .......................................

04. පෞද්ගලික ලිපිනය .......................................

05. උපන් දිනය .......................................

06. ස්ත්‍රී/පුරුෂ භාවය .......................................

.......................... ......................

දිනය අත්සන

................................

පන්තිභාර ගුරුවරයාගේ අත්සන


## ක්‍රියාකාරකම 03

ආරාධනා පත්‍රයක් හදමු.
அழைப்பிதழ் ஒன்றைத் தயாரிப்போம்.

**ආරාධනයයි!**

.................... විදුහල විසින් සංවිධානය කරනු ලබන ........................ 2021 .................. වන දින පෙ.ව. ....................ට ........................... කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. .......................... ....... ඔබ සැමට ආරාධනා.

..................
සංවිධායක කමිටුව




## ක්‍රියාකාරකම 04

**ඉහත ආරාධනාව පිළිගෙන පැමිණි, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට ස්තුති කිරීමේ ලිපියක් ලියන්න.**

மேற்படி அழைப்பை ஏற்று வருகை தந்த வலயக் கல்விப் பணிப்பாளருக்கு நன்றி கூறிக் கடிதம் ஒன்று எழுதுக.